**1**

# පූජනීය උරුමයේ ගතිකත්වය සහ තිරසාරභාවය කේන්ද්‍රකරගත් දේශීය උරුම සංරක්ෂණ සම්ප්‍රදායයේ පරමාදර්ශය රුවන්වැලිසෑ ප්‍රතිසංස්කරණය ද?

**අරුණ රාජපක්ෂ**

## සංක්ෂිප්තය

පූජනීය උරුමයන් සංරක්ෂණය කිරීම පිළිබඳව ශ්‍රී ලංකාවට ඇත්තේ දිගු ඉතිහාසයකි. එසේම ශ්‍රී ලංකාවේ එදා මෙදාතුර සංරක්ෂණ මැදිහත්වීම් පිළිබඳ විවිධ පාර්ශ්ව තුළ ඇත්තේ විවේචනාත්මක මතවාද විවිධත්වයකි. සංස්කෘතික උරුමයේ ප්‍රජා බද්ධ ජීවමාන බව කේන්ද්‍රීය අරමුණක් කරගත් ස්පර්ශනීය, අස්පර්ශනීය උරුම සංරක්‍ෂණ සම්ප්‍රදායේ තිරසාර බව රඳා පැවතියේ තත් සම්ප්‍රදායට අනන්‍ය වූ සාධක නිසාවෙනි. අනුරාධපුර පැරණි නගරය හා සම්බන්ධ උරුම සැලසුම්කරණ ඉතිහාසය තුළ 1949 සිට මේ දක්වා ක්‍රියාත්මක සැලසුම් ප්‍රවේශ හා ඒවායේ අන්තර්ගතය නිරීක්ෂණය කරන්නෙකුට පෙනී යන්නේ ක්‍රමානුකූලව ක්ෂේත්‍රයේ පූජනීයත්වය, ජීවමාන බව හා ස්ථානීය අගයන් සංරක්ෂණය කිරීමේ ප්‍රයත්නයෙන් ක්‍රමානුකූල ඉවත් වී සංවර්ධන හා විද්‍යාත්මක පුරාවිද්‍යා සංරක්ෂණ දිශානතියක් කරා නැඹුරු වන බවයි. මේ තත්ත්වය සැලසුම්කරණයේ හා සංරක්ෂණයේ වෘත්තීමය ආධිපත්‍යය, අන්තර්ජාතික ප්‍රඥප්ති හා සම්මුතිවල බලපෑම, ගෝලීයකරණ ප්‍රවණතා ආදී පෘථුල සන්දර්භයක් තුළ සිදු වූ පරිවර්තනයක් සේ සැලකීම වඩා යෝග්‍ය ය. අනුරාධපුර ස්තූප සම්බන්ධයෙන් සැලකීමේ දී ඓතිහාසිකව රුවන්වැලි සෑය “මහා ථූපය” ලෙස ජන මනසේ සුවිශේෂත්වයක් සටහන් කර තිබුණි. එය ආගමික මෙන් ම ජාතික සංකේතයක් බවට පත්ව තිබුණි. ඒ නිසාම ඓතිහාසිකව ස්ථානය ආශ්‍රිතව විවිධ ආගමික ක්‍රියාකාරකම් සඳහා ප්‍රජා සහසම්බන්ධතාව අඛණ්ඩව / අවිච්ඡින්නව ක්‍රියාත්මක විය. යටත් විජිත අවධියේ සිට එය ප්‍රතිසංස්කරණය උදෙසා දේශීය ප්‍රජාව තුළ ප්‍රමුඛතාවක් විය. සංස්කෘතික සන්ධාරය උපරිම ලෙස පවත්නා විට පූර්ණ

ප්‍රතිසංස්කරණයක් කරා ගමන් කිරීම නොවැළැක්විය හැක්කකි. රුවන්වැලි සෑ චෛත්‍ය වර්ධන සමිතිය පිළිසකර කටයුතු 1873 ආරම්භ වී 1940 ජනවාරි 25 දින කොත් පැළඳවීමේ උත්සවයෙන් අවසන්වන ප්‍රතිසංස්කරණ කටයුත්ත සැබැවින්ම කියාපාන්නේ උක්ත සංස්කෘතික සන්ධාරයේ ප්‍රබලත්වය තුළින් ජනිත කළ අනන්‍යතාව ප්‍රජා මූල සංරක්‍ෂණ ක්‍රියාදාමයන් හරහා සාර්ථක වීමය. මින් ප්‍රකාශ කරන කරුණක් නම් ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ උරුමය ස්ථිතික සංකල්පයක් නොව ගතික සංකල්පයක් බවයි. දේශීය උරුමයේ ජීවමාන ආරෝපිත තත්ත්ව නියෝජනය කරන උරුමයේ භාරකරුවන්ගේ දැක්ම සහ අවශ්‍යතාවන් ද අගයන් සේ සලකා කටයුතු කිරීම ප්‍රායෝගික මෙන් ම උරුමයේ තිරසාර භාවයට ද තීරණාත්මක වේ. රුවන්වැලි සෑ ප්‍රතිසංස්කරණය ශ්‍රී ලංකා ඉතිහාසයෙහි ජගත් උරුම භූමියක් තුළ දේශීය උරුමයේ නෛසර්ගික ගති ලක්ෂණ වන පූජනීයත්වය, ජීවමාන බව, ආධ්‍යාත්මික ගුණය, අවිච්ඡින්නතාව, සංකේතාත්මක අගය වැනි ගති ලක්ෂණ සංරක්ෂණයට ගනු ලැබූ විශිෂ්ට ප්‍රයත්නයක් සේ සැලකිය හැකි ය. සංරක්ෂණයේ දී න්‍යෂ්ටික ප්‍රජා සම්බන්ධතාව, ප්‍රජා ඇල්ම වැනි සංකල්පවලට ගරු කරමින් සිදු වූ සංරක්ෂණක් නිසා උරුමය සහ වර්තමාන ප්‍රජාව අතර සබඳතාව දුරස් කිරීමට වඩා වර්ධනය කිරීමට හේතු වී ඇත. මෙය දේශීය උරුමයේ පුළුල් අරුත සඳහා කදිම පරමාදර්ශයකි.

**මුඛ්‍ය පද :** රුවන්වැලිසෑය, පූජනීය උරුම, සංරක්ෂණය, ප්‍රතිසංස්කරණය, තිරසාර

## 1. සාකච්ඡාව

ශ්‍රී ලාංකේය උරුම සංරක්‍ෂණ සම්ප්‍රදාය මූලිකව බෞද්ධ සහ හින්දු ආගමික මූල බීජ පසුබිම් කොට වර්ධනය වූවක් වන අතර පූජනීය උරුමයන් සංරක්ෂණය කිරීම පිළිබඳව ශ්‍රී ලංකාවට ඇත්තේ දිගු ඉතිහාසයකි. එසේම ශ්‍රී ලංකාවේ එදා මෙදාතුර සංරක්ෂණ මැදිහත්වීම් පිළිබඳ විවිධ පාර්ශ්ව තුළ ඇත්තේ විවේචනාත්මක මතවාද විවිධත්වයකි. සාම්ප්‍රදායිකවාදීන් (Traditionalist) ට අනුව මෑත කාලීන සංරක්ෂණ ප්‍රවේශයන් බොහෝමයක් අතිශය නවීකරණයන් හා සම්බන්ධ ය. එසේ ම නූතනවාදීන් (Modernist) ගේ අදහස වන්නේ ඒවා අතිශය සාම්ප්‍රදායික වන බවයි. මේ අතර සංරක්ෂණවාදීන් යෝජනා කරන්නේ ඒවා දැඩි ප්‍රතිසංස්කරණවාදීන්ගේ (Restorationist) ක්‍රියාකාරකම් බවයි. ප්‍රතිසංස්කරණවාදීන් සිතන්නේ

සංරක්ෂණවාදීන්ගේ සංරක්ෂණයන් සමකාලීන සමාජ ආගමික අවශ්‍යතාව තෘප්තිමත් කිරීමට සමත් නොවන බවයි (Bandaranayake 1992). මේ මතවාද තවත් අයුරකින් විග්‍රහ කරන පිරිස් පවසන්නේ විද්‍යාත්මක සංරක්ෂණය ලෙස හඳුන්වන ද්‍රව්‍ය මූල සංරක්ෂණයන් හරහා ආගමේ අවශ්‍යතාවන් නොසලකා හරින බවයි. මෙම මතවාදී උභතෝකෝටිකයන් දෙස මැදිහත් ලෙසින් නිරීක්ෂණය කළවුන්ගේ අදහස වී ඇත්තේ මේ අතර තුලනයක් හා සංහිඳියාවක් සංරක්ෂණයේ දී සිදු කෙරෙන මැදිහත්වීම්වලින් ජනිත කළ යුතු ය යන්නය. එසේ කළ හැකි නම් උක්ත ගැටුම් සමනය කොට සාර්ථක සංරක්ෂණ ප්‍රවේශයක් මුදුන් පමුණුවා ගත හැකි ය (Godakumbura 1961; Silva 1990; Wijesuriya 1993).

ඓතිහාසික සංරක්ෂණය පිළිබඳව විමසීමේ දී සංරක්ෂණය සඳහා පාදක වූ නිර්මිත දේපල සහ භාණ්ඩ / වස්තු ප්‍රධාන වශයෙන් සරලව කොටස් දෙකකට වර්ග කළ හැකිය.

1. පූජනීය (Sacred)
2. ලෞකික (Secular)

පූජනීය ගණයට අයත් වන පූජනීය, වන්දනීය, ආගමික ගොඩනැගිලි ද්‍රව්‍යයන් බොහොමයක් ආගමික, විශ්වාසවල නියෝජනයන්ද වේ. මේවායේ අගය ඒවා නිර්මිත ද්‍රව්‍ය අයත්වන කාලය, හැඩය ආදියෙන් ඔබ්බට විහිදෙයි. ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ පැරණි නගරයක් ගත් කල ප්‍රධාන වශයෙන් හමුවන්නේ පූජනීය ගොඩනැගිලි සහිත ආරාම සංකීර්ණ සහ ලෞකික අවශ්‍යතා නියෝජනය කරන රාජකීය උපයෝගීතා සහිත ඉදිකිරීම් සහ ජනාවාස සාධකයන්ය. රාජ්‍යය සහ ආගම නිරන්තර සම්බන්ධතා සහිත අවියෝජනීය සංකල්ප දෙකක් වූ බැවින් ඊට සම්බන්ධව ඉදිකිරීම්ද පුරාවිද්‍යා සන්දර්භය තුළ සමීපස්ථව දැකගත හැකිය.

සංස්කෘතික උරුමයේ ප්‍රජා බද්ධ ජීවමාන බව කේන්ද්‍රීය අරමුණක් කරගත් ස්පර්ශනීය, අස්පර්ශනීය උරුම සංරක්ෂණ සම්ප්‍රදායේ තිරසාර බව රඳා පැවතියේ තත් සම්ප්‍රදායට අනන්‍ය වූ සාධක නිසාවෙනි. එම සාධක අතර මානව සම්පතෙහි කාල අවකාශීය අඛණ්ඩතාව ඓතිහාසික දෝලනය තුළ ප්‍රබල ගාමක බලවේගයක් ලෙස ක්‍රියාත්මක විය ( රූප සටහන 1 ).

පාලකයින් - ප්‍රතිපත්ති, නෛතික ප්‍රතිපාදන සහ අනුග්‍රහයෙන්


භික්ෂූන් - ස්පර්ශනීය හා අස්පර්ශනීය උරුමයේ ගතික ජීවමාන බවට මැදිහත් වීමෙන්

ප්‍රභූන් - සම්පත් අනුග්‍රහයෙන්

ශිල්පීය ශ්‍රම බලකාය - තාක්‍ෂණික දැනුමින් හා මැදිහත්වීමෙන්

ප්‍රජාව - සංවේදීව, ස්ථානීය ජීවමාන පැවැත්ම වෙනුවෙන් මැදිහත්වීමෙන්

දේශීය උරුම සංරක්‍ෂණ යාන්ත්‍රණයේ ගතිකත්වය වෙනුවෙන් මැදිහත් වූ ආකාරය මූලාශ්‍ර සාධක තුළින් පැහැදිලිය.




රූප සටහන 1 - දේශිය උරුම සංරක්ෂණ යාන්ත්‍රණය (රාජපක්ෂ 2010:2).

අනුරාධපුර පැරණි නගරය හා සම්බන්ධ උරුම සැලසුම්කරණ ඉතිහාසය තුළ සම්පාදනය වූ හා ක්‍රියාත්මක වූ 1949 අනුරාධපුර සංරක්ෂණ සැලැස්ම, 1984 අනුරාධපුර පූජා නගර සැලැස්ම සහ නූතනයේ ක්‍රියාත්මක වෙමින් පවත්නා 1999

විසල් අනුරාධපුර සංවර්ධන යෝජනා ක්‍රමය ආදී සැලසුම් තුළ නගරයේ ආගමික පූජනීයත්වය හා පූජනීය උරුමය සංරක්ෂණය කිරීම ප්‍රධාන අරමුණක් වී ඇති බව පැහැදිලි ය. පැරණි නගරයේ පූජනීයත්වය මෑතකාලීනව සැලසුම් ප්‍රවේශයක් තුළින් සංරක්ෂණය කිරීමේ ප්‍රථම ප්‍රයත්නය ලෙස 1942 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කරන ලද අනුරාධපුර සංරක්ෂණ පනත හා ඉන් අනතුරුව සැකසෙන අනුරාධපුර සංරක්ෂණ සැලැස්ම පෙන්වා දිය හැකි ය. 1940 වන විට යටත් විජිත පාලනය තුළ මුළු පූජනීය ප්‍රදේශයම පූජනීයත්වයට නොගැලපෙන පරිදි ජරාජීර්ණ වී සැදැහැවතුන් කම්පා කරවන අයුරින් සමාජ ආර්ථික ක්‍රියාකාරකම්වලින් ගහනව පැවති අතර, ඉන් මුදවා ගැනීම අරමුණු කොට පැරණි නගරයෙන් පිටත තදාසන්නව නව නගරය ස්ථාපිත කිරීමට සැලසුම් කොට, 1949 මාර්තු 13 සිට එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම ආරම්භ විය. මෙම කටයුතු 1961 අංක 32 දරණ අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල පනත මගින් පිහිට වූ 1964 අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය හරහා ක්‍රියාත්මක කෙරිණි.

පූජනීය උරුම ක්ෂේත්‍ර සැලසුම් ප්‍රවේශයක් තුළින් ආරක්ෂා කිරීමේ දෙවන ප්‍රවේශය වූයේ 1984 අනුරාධපුර පූජා ප්‍රදේශ සැලසුම් යෝජනා ක්‍රමයයි. මෙම සැලැස්ම තුළින් සුවිශේෂ සැලසුම් ප්‍රවේශයක් හරහා පූජනීයත්වය ආරක්ෂා කිරීම උදෙසා සැලසුම් කෙරිණි. සැලසුම්කරණ ඉතිහාසයේ පූජා නගර සැලසුම් (Sacred city plans) පිළිබඳ ප්‍රථම වතාවට අසන්නට ලැබෙන්නේ අනුරාධපුර පූජා ප්‍රදේශ යෝජනා ක්‍රමයත් (Sacred area scheme) සමගය. මේ සැලස්ම තුළ නිරීක්ෂණය වූ සුවිශේෂත්වයක් නම් ස්පර්ශනීය උරුමය නියෝජනය කරන ඓතිහාසික ස්මාරක ආරක්ෂා කිරීමට කටයුතු කිරීමත්, එහි පූජනීයත්වයට අහිතකර ලෙස බලපාන ක්‍රියාකාරකම් පාලනය කිරීමට කටයුතු කිරීම හා ජීවමාන පූජනීය උරුමයේ තිරසාර භාවය උදෙසා සැලැස්ම මගින් සැදැහැවතුන් හා සංචාරකයින් උදෙසා පහසුකම් සම්පාදනයත් ය. පූජනීයත්වය සංරක්ෂණය කිරීමේ සැලසුම් ප්‍රවේශයක් ලෙස සැලැස්ම තුළ නව නගරය හා පූජා ප්‍රදේශය වෙන් කොට, ඉන් පූජා ප්‍රදේශය නැවත පූජනීයත්වයේ සංවේදීත්වය අනුව අතිශයින් පූජනීය සංවේදී කලාපය (Sacred area inner core),මධ්‍ය ප්‍රදේශය හා තදානුබද්ධ අන්තර් ප්‍රදේශය හා බාහිර ප්‍රදේශය (Sacred area outer core) ලෙස බෙදා කේන්ද්‍රීය මධ්‍ය ප්‍රදේශය නියෝජනය කරන ඇතුළුනුවර, මහා විහාරය, ජේතවනාරාමය, අභයගිරිය විහාරය,

දකුණු දාගැබ සහ මිරිසවැටි විහාරය ඇතුළු කලාපය පූජනීයත්වය ආරක්ෂා කිරීමේ සුවිශේෂී ප්‍රතිපත්ති තුළ සංරක්ෂණය කිරීමට සැලසුම් කිරීම වැදගත් වේ. එසේ ම අන්තර් හා බාහිර ප්‍රදේශය තුළ ද පූජා ප්‍රදේශයට ආවේණික නොවන ක්‍රියාකාරකම් ඉවත් කිරීමේ ප්‍රවේශයක් අනුගමනය කර ඇති අතර ප්‍රදේශයේ පූජනීයත්වයට ගැලපෙන ක්‍රියාකාරකම් තවදුරටත් පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත.

පූජා නගරයේ ස්මාරක ආරක්ෂා කිරීම මෙම පෘථුල සැලැස්මේ මුඛ්‍ය පරමාර්ථය වූ අතර එම අරමුණු සාධනය කර ගැනීමෙහි ලා විවිධ ස්මාරක සංරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නට විය. අනුරාධපුර මිරිසවැටි ස්තූප සංරක්ෂණය, මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් ජේතවන, අභයගිරි හා මහා විහාර ආරාම සංරක්ෂණයන්හි මහා පරිමාණයෙන් පුරාවිද්‍යා ගවේෂණ, කැණීම් හා සංරක්ෂණ ව්‍යාපෘති දියත් විය. මෙම ස්මාරක සංරක්ෂණ ක්‍රියාකාරකම් කෙතෙක් දුරට පූජා නගර සැලැස්ම තුළින් අපේක්ෂිත අරමුණු හා ස්මාරකයන්හි ආගමික පූජනීයත්වය, ජීවමාන බව, සංරක්ෂණය කිරීමට සමත් වී ඇති ද ? යන්න පිළිබඳව මෙම පර්යේෂණය තුළ සාකච්ඡා කර ඇත.

අනුරාධපුර සංරක්ෂණ සැලැස්ම (1949) හා අනුරාධපුර පූජා ප්‍රදේශ සැලසුම් යෝජනා ක්‍රමය, (1984) 1999 වන විට ක්‍රියාත්මක කොට අඩ සියවසක් ගත වීමෙන් අනතුරුවත් පූජා නගරයේ නිසි පරිදි සංරක්ෂණ කටයුතු සිදු කිරීමට නො හැකි වී ඇති බව නාගරික සංවර්ධන අධිකාරියේ උතුරුමැද පළාත් පරිපාලනය සකස් කළ අනුරාධපුර නගර සංවර්ධන සැලැස්මෙහි (2020) සඳහන් වේ.

1949 සිට වර්තමානය දක්වා මධ්‍යම රජයේ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, අනුරාධපුර සංවර්ධන මණ්ඩලය, අනුරාධපුර නගර සභාව ආදී ආයතනික මැදිහත්වීමෙන් මෙම සැලසුම් ක්‍රියාත්මක වීම සිදු වුවත් මෙතෙක් මෙම ක්‍රියාවලිය සම්පූර්ණයෙන් අවසන් වී නැත. පූජා නගරය තුළ තවමත් යළි පදිංචි කරවීමේ කටයුතු අවසන් වී නොතිබීම මීට කදිම නිදසුනකි. මේ නිසා ම සංචාරකයන්ගේ වන්දනාකරුවන්ගේ නො මඳ අවධානයට හා ගෞරවයට ලක්වන පූජා භූමි ප්‍රදේශය මේ අනුව තවමත් අදාළ සංකල්පයට අනුව තහවුරු කිරීමේ හැකියාවක් නො මැති තත්වයක පවතින බව පෙනේ. අනුරාධපුර නගරය ජාතික හා ලෝක

උරුම නගරයක් ලෙස ක්‍රියාත්මක වනුයේ මෙම පූජා නගරය නිසා බව සැළසුම්කරණයේ දී අවධාරණය කර ඇති අතර ඒ නිසා අදාළ ගැටළු කඩිනමින් විසඳීම සිදු කළ යුතුවේ. ඒ සඳහා පූජනීය නගරයේ පරමාර්ථවලට හා අවශ්‍යතාවලට නොගැලපෙන භාවිත හා කාර්යයන් ඉවත් කිරීමත් අනිවාර්ය වේ.

උක්ත පසුබිම තුළින් පැහැදිලි වන්නේ පූජා නගරයේ සංකීර්ණ ගැටලු විසඳීමට මෙතෙක් සැළසුම් ප්‍රවේශ පූර්ණ ලෙස අසමත් වී ඇති හෙයින් ඒ සඳහා නව සැලැස්මක අවශ්‍යතාව පසක් ව පැවති බවයි. මේ අවශ්‍යතාව 1990 වසරේ සිට හඳුනාගෙන තිබූ බව සඳහන් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස අනුරාධපුර නගර සංවර්ධන සැලැස්ම 2020 සම්පාදනය වී ඇති අතර එහි සඳහන් ආකාරයට,

> "පූජා භූමියේ ප්‍රශ්න විසඳීම සඳහා නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව මගින් අදාළ අනෙකුත් ආයතනවල සහභාගීත්වයෙන් ඉදිරිපත් කර ඇත. අනුරාධපුර නගර සංවර්ධන සැලසුම් යෝජනා ක්‍රමය මෙම සැලැස්ම මගින් හඳුන්වා දෙනු ලැබේ"(අ. නා. සං. සැ. 2020).

> "පූජා ප්‍රදේශ තුළ ඇති එම සංකල්පයට පටහැනි කාර්යයන් තවදුරටත් ඉවත් කිරීමටත් ස්මාරක ආරක්ෂා කිරීම, තහවුරු කිරීම හා සංචාරකයින්ට හා බැතිමතුන්ට නිසි පරිදි එම ස්ථාන නැරඹීමට නිතර වන්දනා කිරීමට යාමට අවශ්‍ය පහසුකම් සැලසීමත් අවශ්‍ය වේ." (වි. අ. සං.යෝ.ක්‍ර. 1999:3)

මේ අනුව පූජනීය සංකල්පයට පටහැනි දෑ ඉවත් කිරීම හා පූජනීත්වයට අදාළ ස්මාරක තහවුරු කිරීමත්, පූජනීයත්වයේ ජීවමාන බව, අවිච්ඡින්නතාවට අදාළ ව බැතිමතුන් සඳහා පහසුකම් සැපයීමත් ප්‍රමුඛ කොට ගත් සැලසුම් ප්‍රවේශයක වැදගත්කම උක්ත සඳහන තුළින් අවධාරණය වේ. උක්ත සැලැස්ම තුළ කලාපීයකරණ ප්‍රතිපත්ති යටතේ පුරාවිද්‍යා හා පූජනීය කලාපය පිළිබඳ අනුමත භාවිතාවන් සඳහන් කිරීමේ දී ක්ෂේත්‍රයේ පූජනීය හා ආගමික ජීව ගුණය ආරක්ෂා වීමට බලපාන ආකාරය හා සංචාරක පහසුකම්, එමෙන් ම ඓතිහාසික ආරාමවලට අයත් සංඝාවාස පවත්වාගෙන යාමත් අනුමත කර තිබීම වැදගත් වේ. එසේ ම පැරණි නගරය අවට පිහිටි පුරාණ ගම්මාන හා කුඹුරු ඒ අයුරින් ම පවත්වාගෙන යාම ද දිරිගන්වා ඇත.

1999 වසරේ දී ප්‍රදේශයේ පුළුල් සංවර්ධණ අරමුණු සහිතව හඳුන්වා දෙනු ලබන "විසල් අනුරාධපුර සංවර්ධන යෝජනා ක්‍රමය" පූජනීය පරිසරය සංරක්ෂණය කිරීම අරමුණු කර ඇතත්, එහි සඳහන් වන්නේ අනුරාධපුර සංරක්ෂණය පිළිබඳව අත්‍යවශ්‍ය අනුරාධපුර පූජා ප්‍රදේශ සංවර්ධන යෝජනා ක්‍රමයේ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ තුළ පූජනීයත්වය සංරක්ෂණය සඳහා විවිධ පියවර ගෙන ඇති බවකි .

> "වන්දනාකරුවන්ගේ අවශ්‍යතා හා බලාපොරොත්තු සම්පූර්ණ කිරීම"
>
> "පැරණි ශ්‍රී විභූතිය දක්වන පූජනීය නගරය පිළිබිඹු කිරීම"
>
> "පූජා භූමියට හානිවන වෙළඳාම් නැවැත්වීම"

ඒ අතර වේ.

මේ සැලැස්මෙ විෂය පථය සංරක්ෂණයට වඩා සංවර්ධනය කෙරෙහි යොමු වී ඇති බව සැලැස්මේම අදහස වේ.

> අනුරාධපුර සංරක්ෂණය පිළිබඳ අනවශ්‍ය හුවා දැක්වීමකින් තොරව සංවර්ධන අංශය පිළිබඳව අවධානය යොමු කිරීමක් සිදුවන බව පිළිගන්නා ලදී "
>
> (වි. අ. සං.යෝ.ක්‍ර. 1999:6).

ඒ අනුව මෙකී සැලැස්මේ විෂය පථය හා අන්තර්ගතය තුළ පැරණි නගරයේ පූජනීයත්වය සංරක්ෂණය කිරීම පිළිබඳ අවධාරණය මීට පෙර සැලසුම්වලට සාපේක්ෂව ඌණ බව පෙනේ. එම සැලැස්මේ 5 වන පරිච්ඡේදය තුළ පුරාවිද්‍යා සංරක්ෂණය පිළිබඳ සැලකිලිමත් විය යුතු කරුණු දැක්වීමේ දී පුරාවිද්‍යා ස්මාරක, රක්ෂිත සංරක්ෂණය, පුරාවිද්‍යා සංරක්ෂණය, ඒකාබද්ධ සංරක්ෂණය, පුරාවස්තු, පුරාවිද්‍යා තොරතුරු සඳහා පහසුකම් සැපයීම, අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම, ප්‍රකාශන හා කෞතුකාගාර, තොරතුරු මධ්‍යස්ථාන වැනි අංශ අවධාරණය කරමින් ජීවමාන පූජනීය ක්ෂේත්‍රයක සංරක්ෂණයකට වඩා පුරාවිද්‍යාත්මක ප්‍රවේශයකින් සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කර ඇත.

මේ අනුව 1949 සිට මේ දක්වා ක්‍රියාත්මක සැලසුම් ප්‍රවේශ හා ඒවායේ අන්තර්ගතය නිරීක්ෂණය කරන්නෙකුට පෙනී යන්නේ ක්‍රමානුකූලව ක්ෂේත්‍රයේ පූජනීයත්වය, ජීවමාන බව හා ස්ථානීය අගයන් සංරක්ෂණය කිරීමේ ප්‍රයත්නයෙන්

ක්‍රමානුකූල ඉවත් වී සංවර්ධන හා විද්‍යාත්මක පුරාවිද්‍යා සංරක්ෂණ දිශානතියක් කරා නැඹුරු වන බවයි. එහි උච්චතම අවස්ථාව විසල් අනුරාධපුර සංවර්ධන සැලැස්ම ය. ඒ තුළ මෙතෙක් පූජා නගරය සඳහා සැලසුම්වල වූ සුවිශේෂ අවධානය පෘථුල ප්‍රදේශයක් දෙසටත්, සංරක්ෂණයමය ප්‍රවේශය විද්‍යාත්මක සංරක්ෂණයටත් නැඹුරු වී ඇති බව කිවහැකි ය.

මෙම සැලැස්මේ ප්‍රවේශයට සමගාමී ප්‍රවේශයක් පසුගිය කාලය තුළ ක්‍රියාත්මක ජේතවන, අභයගිරි වැනි ස්තූප සංරක්ෂණ තුළින් ද හඳුනා ගත හැකි විය. මෙහි සඳහන් පුරාවිද්‍යා සංරක්ෂණ අරමුණු, ප්‍රතිපත්ති සහ වැඩසටහන් තුළ පූජා නගරයක පූජනීය බව, ජීවමාන බව සංරක්ෂණය කිරීමට වඩා පැරණි නගරයක නටබුන් පුරාවිද්‍යාත්මකව සංරක්ෂණය කිරීම අරමුණු කර ඇති බව පර්යේෂකයාගේ අදහසයි. මේ තත්ත්වය සැලසුම්කරණයේ හා සංරක්ෂණයේ වෘත්තීමය ආධිපත්‍යය, අන්තර්ජාතික ප්‍රඥප්ති හා සම්මුතිවල බලපෑම, ගෝලීයකරණ ප්‍රවණතා ආදී පෘථුල සන්දර්භයක් තුළ සිදු වූ පරිවර්තනයක් සේ සැලකීම වඩා යෝග්‍ය ය.

උරුම කළමනාකරණ ක්‍රියාදාමය තුළ පූජනීයත්වය සංරක්ෂණය කිරීම පිළිබඳ ව සලකා බැලීමේ දී වෘත්තීයමය ආකල්පයන් ප්‍රජා ආකල්පයන් විමසීමට ලක් කිරීම වැදගත් වේ. ඊට අමතරව දේශපාලන අභිප්‍රායන් යම් ප්‍රමාණයකට සලකා බැලීම ද වැදගත් වනු ඇත. අනුරාධපුර ජගත් උරුම ක්ෂේත්‍රයේ පූජනීයත්වය හා ජීවමාන බව සංරක්ෂණය කිරීම පිළිබඳව පාර්ශ්වකරුවන් වන සංරක්ෂක, කළමනාකරණ වෘත්තිකයින්, ප්‍රාදේශීය ප්‍රජාව, සංචාරකයින් හා සැදැහැතියන් අතර පවතින්නේ ආකල්පමය වශයෙන් සංකීර්ණ තත්ත්වයකි. සංරක්ෂණ සහ කළමනාකරණ වෘත්තිකයින් ක්ෂේත්‍රයේ පූජනීය උරුම සම්පත් සංරක්ෂණය පිළිබඳ පවත්නා නෛතික ප්‍රතිපත්ති පිළිබඳ බහුතරයක් සෑහීමට පත් නොවේ. ඒ සමගම බහුතරයකගේ හැඟීම වන්නේ ජගත් උරුමයක් වීම තුළ දේශීය පූජනීය ජීවමාන උරුම සංරක්ෂණ සම්ප්‍රදායන් කිසියම් අභියෝගයකට ලක් වී ඇති බවකි. ජගත් උරුම ක්ෂේත්‍රයක් වීම තුළ බටහිර කේන්ද්‍රීය සංරක්ෂණ මූලධර්ම නිරායාසයෙන් වෘත්තීයමය ප්‍රවේශයන් හරහා අනුගමනය කිරීමට යාම තුළ විවිධාකාර ගැටලු නිර්මාණය වී ඇති බව බහුතරයක් පිළිගන්නා අතර ජීවමාන පූජනීය උරුම ස්ථාන

සංරක්ෂණය හා කළමනාකරණය සඳහා ප්‍රජා සංවේදී දේශීය ක්‍රමවේදයක අවශ්‍යතාව ද ඔවුන් විසින් පෙන්වා දෙන ලදහ. විශේෂයෙන් සම්මුඛ සාකච්ඡා තුළින් පැහැදිලි වූයේ ද්‍රව්‍යාත්මක හා භෞතික සංරක්ෂණය බටහිර සංරක්ෂණ විද්‍යානුකූලව කටයුතු කිරීම නිසා සාම්ප්‍රදායිකව රැගෙන ආ සංරක්ෂණ ක්‍රමවේදයෙහි වූ ස්ථානය හා බැඳුනු අගයන් සංරක්ෂණය කිරීම තුළින් පූජනීයත්වය ආරක්ෂා කිරීම අමතක කර දමා ඇති බවකි. එය කෙතරම් දේශීය සන්දර්භයට උචිත ද යන්න ප්‍රධාන විවේචනයයි. සංරක්ෂණයන්හි නිරත වෘත්තිකයින් නගන ප්‍රශ්න සහ සිදු කරන ස්වයං විවේචන තුළින් පැහැදිලි වන්නේ ජීවමාන පූජනීය උරුම ක්ෂේත්‍රයක පූජා අවශ්‍යතා සඳහා සමීප වීමකට වඩා විද්‍යාත්මක සංරක්ෂණ අවශ්‍යතා මුදුන් පමුණුවා ගැනීමට යාම තුළ එකී සැබෑ අයිතිකරුවන් වන ප්‍රජාවට අගතියක් සිදු වී ඇති බවකි.

උරුමය හා උරුම සංරක්ෂණය පසුගිය දශක කීපය තුළ අන්තර්ජාතිකකරණය, ආයතනගත වීම සහ වෘත්තිමය ආධිපත්‍යයට නතු වීම වැනි හේතු නිසා තත් ස්ථානාශ්‍රිත භික්ෂූන්ට සහ ප්‍රජාවට පැවරී තිබූ වගකීම් යම් ප්‍රමාණයකට අකර්මණ්‍ය වීම ප්‍රධාන ගැටලුවක් ලෙස හඳුනා ගත හැකි ය. මේ නිසා විද්‍යාත්මක සංරක්ෂණය තුළින් ප්‍රජා බද්ධතාව සමීප කිරීමට වඩා දුරස් කිරීමට හේතු වී ඇති බව වෘත්තිකයන්ගේ අදහසයි. මේ අනුව කැරිස්ට්‍රම් (Karistrom 2004) සඳහන් කරන පරිදි ගෝලීයකරණය නියෝජනය කරන බටහිරකරණය ප්‍රාදේශීය සංස්කෘතික විවිධතාවන්ට තර්ජනයක් ය යන ප්‍රකාශය පැහැදිලි ය.

පූජනීයත්වය සංරක්ෂණය කිරීමේ දී සාමාජීය අභිප්‍රායන් හා ආකල්පයන් වැදගත් වේ. අපගේ තර්කය වන්නේ උරුම සංවාදය තුළ ප්‍රජා මතවාදයන්, අවශ්‍යතාවන් සැලකිය යුතු ලෙස ආන්තිකකරණයකට හා නොසලකා හැරීමකට ලක් වී ඇති බවයි. උරුමය හා සාමාජීය අභිප්‍රායන් සලකා බැලීමේ දී ඒ හා බද්ධ අනන්‍යතාවන් (Identity) තීරණාත්මක ය. අනුරාධපුර පූජනීය නගරය බෞද්ධ උරුමයක් වීම තුළ ඒ හා බද්ධ අනන්‍යතා ගතිලක්ෂණ තුළ පූජනීයත්වය (Sacredness), අධ්‍යාත්මික බව (Spirituality) ආදී සංවේදී කාරණා වැදගත් වේ. උරුමය ගෝලීයකරණය වීම හරහා නිර්මාණය වන ලෝක උරුම සංකල්ප ආරෝපණය තුළ සංස්කෘතික

සමාජාතිකරණ (Cultural homogenization) ව්‍යාපාරය හරහා උක්ත දේශීය අනන්‍යතා සඳහා සිදු වන බලපෑම තීරණාත්මක ය.

ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක උරුම කළමනාකරණ හා සංචාරක කර්මාන්ත සංවර්ධන කටයුතු හරහා පූජනීය පරිසරයට හානියක් සිදු වී නොමැති බව අති බහුතරයක් ක්ෂේත්‍රගත ප්‍රජාව ප්‍රකාශ කිරීම පූජනීයත්වය සංරක්ෂණ පිළිබඳ ව ඔවුන්ගේ සුබවාදී අත්දැකීම් ප්‍රකාශනයකි. එහෙත් සුළු පිරිසක් මෑත කාලීන ආරක්ෂක කටයුතු සඳහා සිදු කරන ලද හමුදාමය ඉදිකිරීම් හා භාවිතාවන්, දේශපාලන මැදිහත්වීම් සහිත අවිධිමත් වාණිජ ක්‍රියාකාරකම්, රථවාහන නැවතුම්පළ හා විහාරාශ්‍රිත ඉදිකිරීම් ආදිය ක්ෂේත්‍රයේ පූජනීයත්වයට හානිකර ලෙස බලපා ඇති බව පෙන්වා දී ඇත.

සංරක්ෂණ වෘත්තිකයන්ගේ පසුගිය දශකය තුළ අත්දැකීම් වලට අනුව වසර 30 කට පෙර ස්තූප සංරක්ෂණ ව්‍යාපෘති ආරම්භ කළ අවධියේ ඒ ආශ්‍රිත පූජනීයත්වය සංරක්ෂණය කිරීම පිළිබඳ ව පැවති උනන්දුව, අපේක්ෂාව හා සංවේදීත්වය සුවිශේෂ එකකි. එයට හේතුව වූයේ දැවැන්ත ස්තූප සිය වන්දනයට හා පූජනීයත්වයට උචිත පරිදි නුදුරු අනාගතයේ සකස් වේය යන අපේක්ෂාවයි. එය ඔවුන් ජේතවන ස්තූප සංරක්ෂණය ආරම්භ කළ දිනයේ අත්දුටු බවත්, එම උනන්දුව ක්‍රමයෙන් හීන වී ගිය බවත් ප්‍රකාශ විය. එයට හේතුව ක්‍රියාත්මක සංරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳ ව ප්‍රජාව තුළ වූ අපේක්ෂා භංගත්වය විය හැකි ය. ප්‍රජා ආකල්පයේ තවත් පැතිකඩක් වූයේ සිදු වෙමින් පවත්නා සංරක්ෂණ කටයුතු සඳහා ප්‍රසාද ජනක ඇගයීම හා සහභාගීත්වයයි. විවිධ සමිති, සමාගම් හා ප්‍රජාසංවිධාන ලෙස ස්වේච්ඡාවෙන් ස්තූප සංරක්ෂණ කටයුතු සඳහා ද්‍රව්‍ය සම්පාදනයට ශ්‍රම පූජාවෙන් දායක වීම දැකගත හැකි විය. එහෙත් මෙම ශ්‍රම පූජා සංකල්පය ප්‍රජාව තුළින් මතු වූ අවශ්‍යතාවකට වඩා මාධ්‍ය නිවේදන, දැන්වීම් ආදී මාධ්‍ය මෙහෙයුමක් තුළින් නිර්මාණය කරන ලද්දක් බව ඒ පිළිබඳ ව සොයා බැලීමේදී පැහැදිලි විය. පූජනීයත්වය සංරක්ෂණය පිළිබඳ ප්‍රජා ආකල්ප මෙම පර්යේෂණ තුළ නියෝජනය කළේ ක්ෂේත්‍රගත ප්‍රදේශීය ප්‍රජාව, වන්දනාකරුවන් හා සංචාරකයින් ය. අනුරාධපුර ක්ෂේත්‍රයේ පූජනීයත්වය, ජීවමාන බව, අධ්‍යාත්මික ලක්ෂණ සුවිශේෂ ගති ලක්ෂණ ලෙස බහුතරයක් ප්‍රජාව විසින් විශ්වාස කරනු

ලැබේ. එසේ ම උක්ත ගති ලක්ෂණ අත්විඳීමේදී උරුම ස්ථාන හා ප්‍රජා භාවිතාව සහ ප්‍රජා සහසම්බන්ධතාව පහසුකරවන බව දෙස් විදෙස් බැතිමතුන්ගේ හා සංචාරකයින්ගේ අදහසයි. ක්ෂේත්‍රයේ ස්මාරක සංරක්ෂණ ක්‍රමවේද, ක්ෂේත්‍රයේ ජීවමාන බව සහ පූජනීයත්වය අත්විඳීම උදෙසා පිටුවහලක් බව බහුතරයක් ප්‍රශ්නාවලිය තුළින්, තහවුරු වූ කරුණක් වුවත් සැලකිය යුතු පිරිසක් ඊට එකඟ නො වන විකල්ප මතයක් ද දරන බව පැහැදිලි විය. සම්මුඛ සාකච්ඡා හා ක්ෂේත්‍ර නිරීක්ෂණය තුළින් මේ සඳහා පිළිතුරක් ලබා ගැනීමට පර්යේෂකයාට හැකි විය. ක්ෂේත්‍රයේ පූජනීය හා ජීවමාන ක්ෂේත්‍ර ලෙස ප්‍රජා ආගමික ක්‍රියාකාරකම් හා සහසම්බන්ධතාව සුවිශේෂ ක්ෂේත්‍ර කීපයක් තුළට සීමා වී ඇති බව පෙනේ. එනම් ශ්‍රී මහා බෝධිය, රුවන්වැලිසෑය, මිරිසවැටි ස්තූපය සහ ථූපාරාම ස්තූපය ඒ අතර පිළිවෙලින් වැදගත් වේ. එහෙත් මෑතකාලීන ව සංරක්ෂිත සුවිසල් ස්තූප ද්වයක් වන ජේතවන ස්තූපය හා අභයගිරි ස්තූපය නිරීක්ෂණයෙන් පැහැදිලි වූයේ ආගමික ක්‍රියාකාරකම් හා ප්‍රජා සහසම්බන්ධතාව සම්බන්ධයෙන් සාපේක්ෂව අවම තත්වයක පසුවන බවයි. මේ අනුව පැහැදිලි වන්නේ අනුරාධපුර පූජා ප්‍රදේශ සංවර්ධන යෝජනා ක්‍රමය මගින් හඳුනාගන්නා ලද මධ්‍ය ප්‍රදේශය නැතහොත් පූජනීය ප්‍රදේශ අභ්‍යන්තර හර කලාපය (Sacred area inner core) නියෝජනය කරන ඇතුළු නුවර, මහා විහාරය ජේතවනාරාමය, මිරිසවැටිය, දකුණු දාගැබ හා අභයගිරිය ආදී ස්ථාන අතර පූජනීයත්වය සම්බන්ධයෙන් සක්‍රීය අති සංවේදී කලාපයක් ලෙස මහාවිහාර සංකීර්ණය නියෝජනය කරන ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි සෑය සහ ථූපාරාම ආදී ආගමික ස්ථාන සුවිශේෂ වන බව ය. උක්ත පූජා නගර මධ්‍ය ප්‍රදේශය පූජා නගරයේ පූජනීයත්වය සම්බන්ධයෙන් සංවේදී කලාපයක් වන බැවින් වන්දනාකරුවන්ගේ වන්දනා පහසුව උදෙසා සංවර්ධිත වට රවුම් පාර සාම්ප්‍රදායික “අටමස්ථාන”,“වට වන්දනා” සංකල්ප ප්‍රතිස්ථාපනය උදෙසා ගන්නා ලද පියවරක් හෙයින් පූජනීයත්වය තිරසාර සංරක්ෂණය උදෙසා ගන්නා ලද සාධනීය පියවරක් ලෙස ද අගය කළ හැකි ය.

'පූජනීයත්වය' (Sacredness) සංකල්පය, ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ නිර්වචනය කර ගැනීමේ දී ස්ථානාශ්‍රිත, ආගමික හැසිරීම් මෙන් ම සංවේදී අත්දැකීම් ද වැදගත් වන හෙයින් ඒ සඳහා උක්ත ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි සෑය, ථූපාරාමය හා

මිරිසවැටිය ආදී ආගමික ස්ථාන වැදගත් වේ. එහෙත් මෑත කාලීනව සංරක්ෂිත ජේතවන හා අභයගිරි ස්තූප සංරක්ෂණ හරහා සැලසුම් ප්‍රතිපත්ති තුළ සඳහන් "වන්දනා කරුවන්ගේ අවශ්‍යතා හා බලාපොරොත්තු සම්පූර්ණ කිරීම", "පැරණි ශ්‍රී විභූතිය දක්වන පූජනීය නගරය පිළිබිඹු කිරීම" වැනි අපේක්ෂාවන් කෙතෙක් දුරට සඵල වී ඇත් ද යන්න ප්‍රජා දෘෂ්ටිකෝණයෙන් ඇගයීමට ලක් කළ යුතු වේ. උක්ත අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා ක්ෂේත්‍රයේ පූජනීය ආගමික භාවිතාවන් සංරක්ෂණය කිරීම තුළින් පූජනීයත්වය අත්විඳීමට සැලැස්වීම තුළින් ක්ෂේත්‍රයේ අනන්‍යතාව ආරක්ෂා කිරීමට හැකි වන බව අපගේ අදහසයි. එහෙයින් උරුම කළමනාකරණ ක්‍රියාවලියේ දී පූජනීය නගරය තුළ උරුම සංරක්ෂණයේ දී ද්‍රව්‍ය මූල සංරක්ෂණ ප්‍රවේශයට වඩා ඇගයීම් මූල ප්‍රවේශය වඩා සාර්ථක බව පෙන්වා දිය හැකි ය.

විශේෂයෙන් වන්දනාකරුවන්ගේ අවශ්‍යතා සහ බලාපොරොත්තු තෘප්තිමත් කිරීමේදී පූජනීය ක්ෂේත්‍රය තුළ ඔවුන්ගේ ස්ථානබද්ධ හැසිරීම් හා ක්‍රියාකාරකම් ප්‍රවේශමෙන් කියවිය යුතු වේ. පැරණි ශ්‍රී විභූතිය දක්වන පූජනීය නගරය පිළිබිඹු කිරීමේ ප්‍රතිපත්තිය මුදුන් පමුණුවා ගත හැක්කේ ඒ තුළිනි. එසේ නොවුනහොත් සැලසුම් ප්‍රතිපත්ති හා සංරක්ෂණ ප්‍රතිපත්ති අතර නොගැළපීමක් හටගන්නා අතර අවසානයේ දී ක්ෂේත්‍රයේ ප්‍රමුඛ අනන්‍යතාව වූ "පූජනීයත්වය" සංරක්ෂණය කිරීම සඳහා ඉවහල් නො වනු ඇත. සංරක්ෂණය තුළින් කෙතෙක් දුරට තථ්‍යතාව, ඒකාබද්ධතාව, අද්විතීය විශ්වීය අගයන්හා භෞතික අගයන්, සංරක්ෂණය කළ ද ඒ සියල්ලටම වඩා සාමාජීය මානය හා ප්‍රජාමානය පූජනීය ක්ෂේත්‍රයක පූජනීයත්වය හා බැඳුනු උරුමයේ ගතිකත්වය සංරක්ෂණයේ දී, එහි තිරසාරභාවය සම්බන්ධයෙන් තීරණාත්මකය. එසේ, උරුමය කාගේ ද? කා සඳහා ද? යන ප්‍රශ්නවලදී ප්‍රජාව කේන්ද්‍රගත වන බැවින් පූජනීය ස්ථාන කළමනාකරණයේ දී ප්‍රජාව පූජනීයත්වය ලෙස තේරුම් ගන්නා සංකල්පයට සමීප වීමේ අවශ්‍යතාව සැලසුම්කරණ, සංරක්ෂණ හා උරුම කළමනාකරණ වෘත්තිකයින් විසින් පැහැදිලි ව තේරුම්ගත යුතු වේ.

ප්‍රජාව සමග ක්ෂේත්‍රයේ පූජනීයත්වය සංරක්ෂණය පිළිබඳ සාකච්ඡා කිරීමේදී පැහැදිලි වූයේ ඒ හා සම්බන්ධ ධනාත්මක මෙන් ම ඍණාත්මක සාධක ද පවත්නා

බව ය. කිසියම් ක්ෂේත්‍රයක ආගමික ක්‍රියාකාරකම් පැවතීම, ආගමික ජීවමාන සංකේත නියෝජනය, ඒවා සංරක්ෂණය කර තිබීම, උක්ත ස්ථානීය බලවේග සහ භෞතික ගති ලක්ෂණ ආදී කාරණා එහි දී වැදගත් වේ. එසේ ම පූජනීයත්වය පිළිබඳ හැඟීම් ජනනයට අහිතකරව බලපාන ඍණාත්මක සාධක ලෙස ස්ථානයක සංචාරකයින්, නරඹන්නන් ලෙසින් සංවේදී බවින් වියුක්තව හැසිරීම, ආගමික ක්‍රියාකාරකම්වලින් වියුක්ත වීම, නාගරික ක්‍රියාකාරකම්, අවිධිමත් වාණිජ ක්‍රියාකාරකම් හා අවිධිමත් නවීන ඉදිකිරීම් තාක්ෂණික මෙවලම් ආදිය බලපානු ලැබේ.

අනුරාධපුර පූජනීය නගරයේ ස්ථානගත වූ ස්ථාන ආශ්‍රයෙන් සිදු කරන ලද නිරීක්ෂණාත්මක ඇගයීමෙන් ප්‍රකට වූ කරුණක් වන්නේ පූජනීයත්වය සංරක්ෂණයේ දී එහි සාර්ථකත්වය උදෙසා කාරණා කීපයක තුලනයක් අවශ්‍ය බවයි. එනම් පූජනීය ක්ෂේත්‍රයේ ආගමික සංකේතාත්මක අංගයන්ගේ සංරක්ෂණ අවශ්‍යතාව, සංචාරකයින්ගේ හා වන්දනාකරුවන්ගේ අත්දැකීම් හා භාවිතාවත් අතර මනා තුලනය (මෙකී තුලනය සාක්ෂාත් කර ගැනීම සම්බන්ධව අනුරාධපුර පූජනීය නගරයේ විවිධ ස්ථාන පසුවන්නේ විවිධ අදියරයන්හි ය) ආදියයි.

එබැවින් ස්මාරක සංරක්ෂණ ක්‍රියාදාමයන් ආගමික ප්‍රජා අවශ්‍යතාවන් ඉටු කරන, ප්‍රජා භාවිතාවන් දිරිගන්වන සුළු වීම පූජනීයත්වය සංරක්ෂණය කිරීමේදී වැදගත් වේ. ස්මාරක, පූජනීයත්වය ජීවමානබව, සම්ප්‍රදය හා සංස්කෘතිය වැනි කාරණා සංයුක්ත ප්‍රවේශයක් සංරක්ෂණය කිරීමේ අභියෝගය සංරක්ෂණ වෘත්තිකයින් අභිමුව පවතී. උක්ත සංකල්ප සුසංයෝග වූ පමණට ස්මාරකයන්ට ජීවමාන සංස්කෘතියේ කොටසක් බවට පත් විය හැකි ය. අනුරාධපුර පූජනීය නගරයේ සංචාරක ආකර්ෂණය පිළිබඳව සිදු කරන ලද ඇගයීමෙන් අනාවරණය වූ කරුණක් වූයේ පූජනීය නගරයට පැමිණෙන බහුතරයක් ආගමික වන්දනාකරුවන් /සංචාරකයින් වීම තුළ ඔවුන්ගේ ප්‍රබල ආකර්ෂණයක් වී ඇත්තේ සක්‍රීය පූජනීය ගතිලක්ෂණ සහිත ස්ථානයක් නියෝජනය කරන මහාවිහාර (ශ්‍රී මහා බෝධිය රුවන් වැලි සෑය) සංකීර්ණයයි. ක්ෂේත්‍රයට පැමිණෙන වන්දනාකරුවන් /සංචාරකයින්ගෙන් 100%ක් අත්විඳින ක්ෂේත්‍ර බවට ඒවා පත් ව ඇත. එහි රහස පෙර සඳහන් කළ සංකල්පයන් ගේ සුසංයෝගයයි. මේ අනුව ස්ථානීය

පූජනීයත්වය සංරක්ෂණ හා සංචාරක ආකර්ෂණය අතර ද පැහැදිලි සබඳතාවක් ආගමික පූජනීය ක්ෂේත්‍රයන්හි පවත්නා බව පැහැදිලි ය.

අනුරාධපුර පූජා නගරය ලෝක උරුම ක්ෂේත්‍රයක් ලෙස නම් කිරීමට නාම යෝජනා සඳහා තෝරාගැනීමේ පදනම තුළ ක්ෂේත්‍රය හඳුනාගනු ලබන්නේ පෞරාණික ගොඩනැගිලි සහ නිර්මාණවලින් යුත් භූමි භාග 6 න් 1 ක් ලෙස මිස ජීවමාන උරුමයට හිමිකම් කියන පූජා නගරයක් ලෙස නොවේ. මහනුවර පූජා නගරය පමණක් ජීවමාන සාම්ප්‍රදායික සංස්කෘතික උරුමයක් ලෙස හඳුනාගැනීමත්, අනුරාධපුර පූජා නගරය එකී සන්දර්භයෙන් වියුක්ත කිරීමත් එවැනි අවස්ථාවකි. ජීවමාන මානය කෙරෙහි දක්වා ඇති අවම අවධානය වෘත්තිකයින්ගේ මානයේ ගැටලු සහගත අවස්ථාවකි.

යුනෙස්කෝ විධායක කමිටුවට සාධාරණය ඉටු කිරීමක් වශයෙන්ද, අන්තර්ජාතික යුක්ති යුක්තභාවය තහවුරු කිරීම සඳහාද, යුනෙස්කෝ නිර්ණායකයන්ට යෝග්‍ය වීම සඳහා තෝරාගනු ලැබූ එක් එක් ස්ථානය සුදුසුකම් ලබන කිසියම් විශිෂ්ට ගුණාංගයක් වෙන්කර හඳුනා ගැනීම මැනැවැයි සලකන ලදි. මේ අනුව පෞරාණික ගොඩනැගිලි සහ නිර්මාණවලින් යුත් භූමි භාග හයකුත්, ජීවමාන සාම්ප්‍රදායක සංස්කෘතික උරුමය පිළිබඳ එක ව්‍යාපෘතියකුත් වෙන් කර හඳුනාගැනීමට තුඩු දුන් හේතු රෝලන් සිල්වා (Silva 1990) විසින් පෙන්වාදී ඇත.

අනුරාධපුර පූජා නගරය සැබැවින්ම ජීවමාන උරුමයට සාක්ෂි දරන උරුම නගරයකි. මෙකී ජීවමාන බව වෘත්තිකයින් විසින් නිසි පරිදි හඳුනා නොගැනීම එදා මෙදා තුර ස්මාරක සංරක්ෂණයේ අර්බුද නිර්මාණය කිරීමට හේතු වී ඇති බව අපගේ අදහසයි.

අනුරාධපුර පූජා නගරයේ ස්මාරක සංරක්ෂණයන්ට පුරෝගාමී වූ පරණවිතාන, ගොඩකුඹුර, රෝලන්ඩ් සිල්වා, විජේසූරිය වැනි විද්වතුන් උරුමයේ ආගමික ජීවමාන බව හොඳින් අවබෝධ කොටගෙන සිටි බව පැහැදිලි ය (Paranavithana 1947; ASCAR 1961/62; Silva 1990). එහෙත් ඔවුනගේ මෙම සංකල්පීය හඳුනාගැනීම ප්‍රායෝගික සංරක්ෂණයන් තුළින් ඉටු කළ හැකි වීද? යන්න ඇගයීමට ලක්විය යුත්තකි.

පූජනීය බව බෞද්ධ ආගමික උරුමය සෙසු උරුමයන්ගෙන් වෙනස්වන සුවිශේෂ උරුම කරගත් ලක්ෂණයකි. බුදු දහමේ හරය වන ත්‍රිවිධ රත්නය (බුද්ධ, ධම්ම, සංඝ) පදනම් කර ආගමික ආරාමයන්හි නේක විධ වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් සිදු කරන ලදි. ඒවා පරම්පරාවෙන් පරම්පරාවට සිව්වනක් පිරිස (භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා) හරහා අඛණ්ඩව පවත්වාගෙන ඒමට කටයුතු කිරීම සම්ප්‍රදායයි.

බෞද්ධ උරුමය අඛණ්ඩව රැක බලාගැනීම සඳහා අලුත්වැඩියා කිරීම්, ප්‍රතිසංස්කරණ සහ විටෙක නව ඉදිකිරීම් ආදී විවිධ මැදිහත්වීම් සිදුකරන ලදි. මෙය සුවිශේෂ පූජනීය බෞද්ධ උරුම සංරක්ෂණ සම්ප්‍රදායක් ලෙස ශ්‍රී ලංකාව තුළ වර්ධනය වූවකි. ආරාම විසින් ම උරුමයේ නිර්මාණයත්, ඒවා ආරක්ෂා කිරීමේ සම්ප්‍රදායත් ස්ථාපිත කර ඇත. ආගමික ස්ථානයන්හි බෝධිය සහ ස්තූප වැනි ස්පර්ශනීය ප්‍රධාන සංකේත ලෙස නිර්මාණය වන්නේ වන්දනය, පූජනීය සහ අනුස්මරණය වැනි හේතු පදනම් කරගෙනය. ආරාමයක බෝධියක් රෝපණය කළ විට, එමෙන් ම ස්තූපයක ධාතු තැන්පත් කළ විට ඒවා ආරාමයේ ස්ථිර වස්තු බවට පත්වන අතර, අඛණ්ඩව රැක බලාගැනීම අපේක්ෂා කරන ලදි. මෙම උරුමයේ අගයන් සහ ඒ හා අනුබද්ධ ප්‍රජාවගේ ජීවමාන පැවැත්මේ රහස මෙම අඛණ්ඩ ගතිකත්වයයි. එහෙයින් ඒ හා අනුබද්ධ ප්‍රජාව උරුමයේ අඛණ්ඩතාව හා ආගමික උරුමයේ නෛසර්ගික අගයන් සංරක්ෂණය සම්බන්ධයෙන් තීරණාත්මක සාධකයක් බව පෙනේ. බෞද්ධ පූජනීය ආගමික උරුම සංරක්ෂණයේ දී භෞතික සංරක්ෂණ අවශ්‍යතා පමණක් නොව තදනුබද්ධ ආගමික ප්‍රජාවගේ අවශ්‍යතා තුලනය කිරීම සඳහා සුවිශේෂ ප්‍රතිපත්තිමය ප්‍රවේශයන් අනුගමනය කිරීම වැදගත් වේ.

අප විසින් අධ්‍යයනයට බඳුන් කරන ලද අනුරාධපුර පූජා නගරයේ විවිධ කාල අවකාශයන්ට අයත් ස්තූප සංරක්ෂණ සතරෙහි ම අඛණ්ඩව දිවෙන අර්බුදයක් පවතී. එනම් සංරක්ෂණයේ ද්‍රව්‍යාත්මක, භෞතික, විද්‍යාත්මක අවශ්‍යතා අවධාරණය කරන වෘත්තීමය පාර්ශ්වය සහ අනුබද්ධ ප්‍රජාව අතර දෘෂ්ටිමය අර්බුදයයි. උක්ත වෘත්තිමය පාර්ශ්වය උරුම සංරක්ෂණයේ දී අතීතය සහ අනාගත ප්‍රජාව පිළිබඳ සංවේදී වෙමින් ද්‍රව්‍යාත්මක සංරක්ෂණයක් තුළින් වර්තමාන සමාජයේ උපයෝගීතාවන් සහ අයිතීන් අවතක්සේරු කිරීමක් සිදු කරන්නේද? ප්‍රජාවගේ හඬ තුළ ගැබ් වී ඇති අරුත වන්නේ බෞද්ධ පූජනීය උරුමයේ අඛණ්ඩ පැවැත්මේදී වර්තමානය ඉතා වැදගත් බවයි. යටත් විජිත පාලන සමයේ රුවන්වැලි සෑ ප්‍රතිසංස්කරණයේ දී තත් වර්තමානය නියෝජනය කළේ ප්‍රතිසංස්කරණ සමාගම්

විසිනි. ප්‍රතිසංස්කරණ සමාගම් නියෝජනය කළ එම වර්තමානය වෘත්තික ප්‍රජාවගේ නිර්දය විවේචනයට ලක්වූයේ පහත සඳහන් අන්දමට ය.

- සැදැහැති විනාශකරුවන් (pious vandals)
- අනුරාධපුරය ක්‍රමයෙන් මෙම ප්‍රතිසංස්කරණ රුචිකත්වය විසින් විනාශ කරමින් සිටී
- එවැනි ප්‍රතිසංස්කරණ සියලු පුරාවිද්‍යා මූලධර්මයන්ට විරුද්ධ ය
- 'මෙම විනාශකාරී ක්‍රියාවන්.''.
- ශ්‍රී ලංකාවේ බොහොමයක් පැරණි ගොඩනැගිලි සැදැහැති නමුත් අකලාත්මක, අවිද්‍යාත්මක ප්‍රජාව විසින් ප්‍රතිසංස්කරණය කර ඇත..... එය සමාන වන්නේ කොළඹ පිටිසර පළාතක තුන්වන පන්තියේ බංගලාවකටය... (ASCAR 1931; Wijesuriya1993).

එදා විදේශීය වෘත්තිකයින් විසින් දේශීය ප්‍රජා සංගත ප්‍රතිසංස්කරණ සමාගම් හරහා ගෙන ගිය ප්‍රජා සංරක්ෂණ ප්‍රවේශය උපහාසාත්මකව සහ නිර්දය ලෙස අවිද්‍යාත්මක, අකලාත්මක ක්‍රියාවක් ලෙස විවේචනය විය.

කෙසේ වෙතත් නිදහසින් පසු දේශීය වෘත්තිකයින් හා දේශපාලන අධිකාරිය ප්‍රජා අවශ්‍යතාවට සංවේදී වීමේ ප්‍රතිඵලයක් ලෙස විද්‍යාවේ අවශ්‍යතාවත්, ආගමේ අවශ්‍යතාවත් තුලනය කිරීමේ ප්‍රයත්නයක යෙදුණු ආකාරය මිරිසවැටි ප්‍රතිසංස්කරණය තුළින් පැහැදිලි ය. වෘත්තිකයින් මෙකී ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රවිෂ්ඨ වන්නේ පවත්නා වූ කළමනාකරණ යාන්ත්‍රණය මෙන් ම නෛතික යාන්ත්‍රණය තමන්ට අවශ්‍ය පරිදි සුඛනම්‍ය කරගනිමිනි. එහෙත් ඉන්පසු ජගත් තලයේ උරුමය ගෝලීයකරණය වීමේ ප්‍රතිඵලයක් ලෙස ජගත් උරුම සංකල්පයේ, ජගත් ප්‍රඥප්තීන්ගේ, ජගත් ආයතනයන්ගේ මෙන් ම වෘත්තිකයින්ගේ ස්මාරක සංරක්ෂණ ආධිපත්‍යයට ක්‍රමයෙන් අවනත වීමේ ප්‍රවණතාවක් යුනෙස්කෝ ශ්‍රී ලංකා සංස්කෘතික ත්‍රිකෝණ වැඩසටහන යටතේ හඳුනාගත හැකි ය. එය බටහිර ඇගයීම් අනුව සංරක්ෂණ ප්‍රමිතිකරණයකට නතු වීමක්ද වේ. එසේ ම මේ හරහා සමාජීය ඇගයීම් හා සංස්කෘතික සංවේදීත්වය, විද්‍යාත්මක සංරක්ෂණය අභිමුව අභියෝගයට ලක් වී ඇත. පූජනීය උරුම භූමීන්හි ජීවමාන බව සංචාරක ව්‍යාපාරය හරහා ලෞකිකකරණයට ලක්වීම තුළ පූජා නගර සංකල්පය ද අභියෝගයට ලක් වී ඇත. (වෘත්තිකයින්ගේ අභයගිරි ස්තූපයේ සංරක්ෂණ ප්‍රවේශය අභිමුව විකල්ප මතයක්

ලෙස ඉස්මතුව ඇත්තේ මීට දශක කීපයකට පෙර රුවන්වැලි සෑ ප්‍රතිසංස්කරණය තුළ මතු වූ ප්‍රජා හඬම ය.)

සංස්කෘතික උරුම සම්පත්, ඓතිහාසික ස්ථාන ස්පර්ශනීය සම්පත්වලින් මෙන්ම අස්පර්ශනීය සංස්කෘතික ක්‍රියාකාරකම් වලින්ද සමන්විත වේ (Mckercher and du cross 2002). සංස්කෘතික උරුම ස්ථාන අතීතයට අයත් නටඹුන් පමණක් නොවේ (Bianca 2000). මෙම සම්පත් ආරක්ෂා කිරීමට පෙළඹෙන්නේ ඒවායේ පවත්නා වූ සංචාරක ආකර්ෂණ අගයට වඩා ඒවායෙන් ප්‍රජාවට ඇති නෛසර්ගික අගය නිසාය ( Wongsa 2004). මෙම ස්ථාන ප්‍රජාවට අනන්‍යතාව පිළිබඳ හැඟීම සපයමින් සංස්කෘතික සම්ප්‍රදායන්ගේ අඛණ්ඩ පැවැත්මට සහාය වේ (Dearborn and Stallmayer 2010). ස්ථානයක ඓතිහාසික ගතිලක්ෂණය ආරක්ෂා කිරීම වැදගත් වූවද, ආගමික අර්ථයෙන් තත් ස්ථානය වන්දනය කරන්නා වූත්, එම ස්ථානය අලුත්වැඩියා කිරීම් හරහා සමකාලීන භාවිතාවන්ට ගැළපෙන අයුරින් සකස් කර ගැනීම ද වැදගත් වේ. පූජනීයත්වය බොහෝ විවිධාකාර වූ ස්ථානයන්ට ආරෝපණය කළ හැකි වුවත් ආගමික ස්ථාන ඒ අතර වඩා වැදගත් වේ (Chidester and Linenhatl 1995).

පූජනීය ස්ථානයක් විවිධ වූ දෘෂ්ටිකෝණයන්ගෙන් නිර්වචනය කළ හැකි අතර ඒ අතර හැසිරීම්, හැඟීම් සහ ස්ථානීය අනන්‍යතාවන් වැදගත් වේ. මෙම කාරණාවන් පූජනීය ස්ථානයක් සම්බන්ධයෙන් සැලකීමේදී අවියෝජනීය ලෙස බැඳී පවතින කාරණාවන් වන අතර ස්ථානයක පූජනීයත්වය තේරුම් ගැනීම සඳහා ආධාරකද වේ. පූජනීය ස්ථානයක අර්ථය මතු වී පෙනෙන්නේ එහි සිදුවන හැසිරීම් තුළිනි. ආගමික ක්‍රියාකාරකම් සඳහා අරුතක්, සන්දර්භයක්, ආධාරකයක් සැපයීමට පූජනීය ස්ථාන සමත් වේ. ඒ අනුව ස්ථානයේ අර්ථය එහි හැසිරෙන, භාවිත කරන ප්‍රජාවගෙන් මතු වී පෙනේ. බෞද්ධ සන්දර්භය තුළ පූජනීය ස්ථාන (Sacred places) හුදු ආගමික ක්‍රියාකාරකම් සඳහා පමණක් සීමා නොවේ. නිදසුනක් ලෙස ගතහොත් අනුරාධපුර පූජා නගරය සංකීර්ණ, පෘථුල පූජනීය ක්ෂේත්‍රයකි. මෙම සන්දර්භය ප්‍රජා උත්සව, ආගමික උත්සව, සැමරුම්, සමාජ සේවා කටයුතු, ආධ්‍යාත්මික ආගමික වතාවත් සිදුවන එමෙන් ම භික්ෂූන්ගේ අධ්‍යාපනික, නේවාසික මධ්‍යස්ථානයක්ද වේ. ඒ අතර වන්දනාකරුවන්ගේ සහ සංචාරකයින්ගේ වන්දනයට සහ සංචාරණයට ලක්වන ස්ථානයක්ද වේ.

බොහෝ සමාජීය විද්‍යාඥයින්ට අනුව කිසියම් ස්ථානයක පූජනීයත්වය යනු මිනිසුන් ස්ථානයන් සමග කරනු ලබන අන්තර්ක්‍රියාවෙන් හටගන්නා සංවේදී අත්දැකීමක් ය (Emotional experience). පූජනීය ස්ථානයන් විසින් විවිධාකාර වූ සංවේදී අත්දැකීම් ප්‍රවර්ධනය කරනු ලැබේ. ආධ්‍යාත්මික අගය (Spiritual value) ඒ අතර සුවිශේෂයි. අනුරාධපුරයට වන්දනාවේ පැමිණෙන සැදැහැති වන්දනාකරුවන් ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි සෑය වැනි ස්ථානයන් සමග කරනු ලබන අන්තර් ක්‍රියාවේදී මෙකී සංවේදී අත්දැකීම් අත්විඳිනු ලබයි. පූජනීය ස්ථාන සමග බද්ධවන බෞද්ධ ප්‍රජාව බුදුන් කෙරෙහි ගෞරවය අත්විඳියි. බෞද්ධ පූජනීය ස්ථාන ආශ්‍රිත ස්තූපය, බෝධිය, පිළිමගේ වැනි ආගමික ස්ථාන ආශ්‍රිතව මෙකී සංවේදී අත්දැකීම ශ්‍රී ලාංකීය සංස්කෘතිය තුළ අපි 'බුද්ධාලම්බන ප්‍රීතිය' ලෙස හඳුන්වමු.

පූජනීයත්වය යනු ස්ථානීය අනන්‍යතා (Place identity) සමගද සම්බන්ධ වූවකි. අනුරාධපුර පූජා නගරයේ අටමස්ථාන අතිශයින් පූජනීය ස්ථාන ලෙස සැලකේ. එම ස්ථානයන් බෞද්ධාගමික සංසිද්ධීන්ට සම්බන්ධ වීම නිසා ආගම විසින් තත් ස්ථාන පාරිශුද්ධත්වයට පත් කිරීම විවිධ ඓතිහාසික මෙන් ම ජනප්‍රවාදගත තොරතුරු මගින් සිදුකර ඇත. එමෙන් ම රුවන්වැලි සෑය, මිරිසවැටි ස්තූපය, ථූපාරාමය වැනි ස්තූප බුදුන්ගේ පහස ලැබීම, බුදුන්ගේ ධාතු තැන්පත්ව පැවතීම, පාද ස්පර්ශයෙන් පාරිශුද්ධ වීම වැනි විශ්වාස නිසා අතිශය පූජනීය ලෙස සැලකේ. මේ අනුව පූජනීයත්වය ඍජුවම ස්ථානීය බද්ධ කාරණයකි. මෙලෙස ස්ථානීය හැසිරීම්, හැඟීම් සහ අනන්‍යතා බද්ධ පූජනීයත්වය සංරක්ෂණය කිරීම ශ්‍රී ලංකාවේ සංරක්ෂණ ඉතිහාසයේ මුඛ්‍ය පරමාර්ථය වී ඇත.

## 2. උපයෝගිතාව

Wijesuriya (2003) පෙන්වා දෙන පරිදි සෑම උරුමයකට ම ඒවා නිර්මාණය වීමේදී නිශ්චිත කාර්යයක් පවතී. බෞද්ධ ආරාමික අංගයක් (ස්තූප, බෝධිඝර, පටිමාඝර, පධානඝර, පොහොය ගේ, පංචාවාස, දානශාලා) නිර්මාණය වන්නේ මූලික වශයෙන් බුදුන්, දහම්, සඟුන් යන ත්‍රිවිධ රත්නයේ අවශ්‍යතා සඳහා ය. සාමාන්‍ය ප්‍රජාවට ඒවා වැදගත් වන්නේ වන්දනය සහ වන්දනාවේ යාම සඳහා ය. මෙකී ආරෝපිත කාර්යයන් පවත්වා ගැනීම සඳහා විවිධ ඉදිකිරීම්,

ප්‍රතිසංස්කරණයන් සිදුකර ඇත. කිසියම් ස්මාරකයක් සංරක්‍ෂණය කිරීමේ සන්ධිස්ථානයේ දී වඩාත් ප්‍රබල ප්‍රජා අවශ්‍යතාවක් වන්නේ මෙකී ස්ථානීය බද්ධ උපයෝගීතාව නැතහොත් ක්‍රියාකාරකම් ප්‍රතිස්ථාපනය කිරීම ය. උරුමයේ මූලික සංකල්ප දෙකක් හඳුනාගනී. එනම් ද්‍රව්‍යමය නැතහොත් වස්තුමය උරුම (Heritage of objects) හා සංකල්පමය උරුම (Heritage of idea) යනුවෙනි. වස්තුමය උරුමය උරුමයේ සංකේතාත්මක සන්නිවේදනය නියෝජනය කරන අතර සංකල්පමය උරුමය නියෝජනය කරන්නේ කිසියම් උරුමයක් හා බැඳුණු ක්‍රියාකාරකම්ය. සමස්ත උරුම සන්නිවේදනයේ දී උක්ත අනන්‍යතාව රූප විද්‍යාත්මක ලක්‍ෂණ මෙන් ම ක්‍රියාකාරකම්ද වැදගත් වේ. සම්ප්‍රදයික ස්තූප සංරක්ෂණය තුළින් අපේක්ෂා කළේ එයයි.

## 3. උරුමය සංරක්‍ෂණය හා ප්‍රජා සබඳතාව

ශ්‍රී ලංකාවේ උරුම සංරක්‍ෂණය ආයතනික රාමුවක් තුළ ස්ථාපිත වීම 1890 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ස්ථාපිත වීම සහ නෛතික රාමුවක් තුළ ස්ථාපිත වීම 1940 පුරාවස්තු ආඥා පනතේ ප්‍රභවයත් සමග සිදු විය. මෙය පසුගිය දශක කීපය තුළ දේශීය මෙන් ම ජාත්‍යන්තර වශයෙන් නෛතික සහ ආයතනමය රාමුවක් තුළ ක්‍රියාත්මක වීම යම් ආකාරයකට උරුමය සංරක්‍ෂණය සහ ප්‍රජාව අතර සබඳතාව දුරස් කරවීමට හේතු වී ඇත. මේ හරහා උරුම සංරක්‍ෂණයේ ආයතනික සහ වෘත්තිමය මෙන් ම නෛතික ආධිපත්‍ය තහවුරු වීම හරහා ප්‍රජා මූල ආධිපත්‍යය ආන්තිකකරණය වීමක් දක්වා ගමන් කිරීම උරුමය සහ ප්‍රජා සබඳතාවට ඍණාත්මක බලපෑම් රැසක් එල්ල කිරීමට හේතු වී ඇත.

අනුරාධපුර පූජා නගරයේ ප්‍රධාන ආගමික පූජනීය ස්ථාන නියෝජනය කරන අටමස්ථාන සම්බන්ධයෙන් සැලකීමේ දී ප්‍රජාව ඒවායේ භෞතික මැදිහත්වීම් තුළින් අපේක්‍ෂා කර ඇත්තේ ආගමික, පූජනීය, ආධ්‍යාත්මික උපයෝගීතාවන් ප්‍රතිස්ථාපනය කරමින් අඛණ්ඩව පවත්වාගෙන ඒම ය. මෙකී අඛණ්ඩතාව තුළ ජීවමාන බව මෙන් ම පරිණාමීය වෙනස්වීම් ද අනිවාර්ය වේ. උපයෝගීතාව පවත්වාගැනීම සඳහා නව ද්‍රව්‍යමය මැදිහත්වීම් සිදුකෙරේ. මින් පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ ද්‍රව්‍යමය මැදිහත්වීම් ද්විතියික වන අතර ප්‍රමුඛ වන්නේ උපයෝගීතාව බවයි. සාම්ප්‍රදායිකව උරුම කළමනාකරණයත්, සංරක්‍ෂණයත් තුළින්

සිදුවූයේ එම උරුමයට අදාළ වන ප්‍රජාවට ඒ හා සංවේදීව බද්ධ වීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමයි. ශ්‍රී ලාංකේය උරුමයන් වර්තමානය දක්වා පැවැත්මේ රහස එකී යාන්ත්‍රණයයි. මෙකී ශ්‍රී ලාංකේය උරුම කළමනාකරණ සුසමාදර්ශය සහ බටහිර සුසමාදර්ශය (Paradigm) අතර විසටනයක් මෑතකාලීන ලෝක උරුම සන්දර්භය තුළ සංරක්ෂිත උරුම භූමීන්හි ජනිතව ඇත. මෑත කාලීන උරුම සංරක්‍ෂණ ව්‍යාපෘති වන ජේතවන, අභයගිරි ස්තූප සංරක්‍ෂණ හා රුවන්වැලි සෑ, මිරිසවැටි ස්තූප සංරක්‍ෂණ සංසන්දනාත්මකව අධ්‍යයනය කර බලන විට මෑත කාලීන සංරක්‍ෂණ හරහා උරුමය සහ ප්‍රජාව අතර විසංවාදයක් නිර්මාණය වී ඇති බව පෙනේ. මෙම විසංවාදීභාවයට හේතුව නූතන වෘත්තිකයින්ගේ සංරක්‍ෂණ මැදිහත්වීම් හුදු ද්‍රව්‍යාත්මක සංරක්ෂණයක් කිරීම අරමුණු කර ඇතත්, දේශීය සාමාජීය උපයෝගීතාවන් ආමන්ත්‍රණය කිරීම අවතක්සේරු කිරීමයි.

සෑම උරුමයකටම අයිතිකරුවෝ නැතහොත් පාර්ශ්වකරුවෝ සිටිති. විජේසූරියට (2004) අනුව එම සංස්කෘතික ප්‍රජාව (Cultural community) එකී ස්ථානාශ්‍රිතව සිය ක්‍රියාකාරකම්හි නිරත වේ. වැනිසියේ ප්‍රඥප්තියේ (Vanice Charter) 5 වන සටහන යටතේ මෙන් ම තථ්‍යතාව පිළිබඳ නාරා ලේඛනයේ (Nara document) 8 වන සටහන යටතේ සාමාජීය උපයෝගීතාව මෙන් ම උරුම කළමනාකරණයේ දී තත් උරුමයේ නිර්මාපක ප්‍රජාවට ප්‍රමුඛත්වය දිය යුතු බව පැවසේ. අනුරාධපුර පූජා නගරයේ පූජනීය ස්ථාන (ස්තූප, බෝධි, ප්‍රතිමාඝර ආදී) නිර්මාණය වූයේ බෞද්ධ ප්‍රජාවට සිය ආගමික ක්‍රියාකාරකම්වල නිරත වීම සඳහා ය. විජේසූරිය ප්‍රකාශ කරන පරිදි ඒවා සදාකල් පවතින්නට කළා යැයි පවසන අදහස බුදු දහමේ මුඛ්‍ය සංකල්පයක් වන අනිත්‍යතා සංකල්පය සමග ප්‍රතිවිරුද්ධ වූවකි. විශේෂයෙන් ස්තූප නිර්මාණයේ දී ස්තූපයේ අවකාශයන් වන සලපතල මළුව, වැලි මළුව මෙන් ම පිට ප්‍රාකාරයෙන් පිටත ආලින්දයක් නිර්මාණයෙන් අපේක්‍ෂා කළේ තත් ස්ථාන කරා පැමිණෙන විශාල ප්‍රජාවක් සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමකි. මහා විහාරය, අභයගිරිය, ජේතවනය වැනි සුවිසල් ආරාම සංකීර්ණයන්හි ඓතිහාසික පැවැත්ම සහ තිරසාරභාවය තහවුරු කළේ එම ප්‍රජා සහ සම්බන්ධතාවයි. මෙම සබඳතාව විවිධ මුහුණුවරින් එනම් බැතිමතුන්, වන්දනාකරුවන්, උපාසක උපාසිකාවන් හරහා ක්‍රියාත්මක විය. එම පූජනීය ස්ථාන සංරක්‍ෂණයේ දී එකී ප්‍රජාවට සංවේදී වීමද අන්‍යෝන්‍ය වශයෙන් උරුමයේ තිරසාර භාවයට හේතු වේ. විශේෂයෙන් බෞද්ධ ජීවමාන පූජනීය ආගමික ක්ෂේත්‍රයන්හි ජීවමාන බව නැතහොත් ගතිකත්වය

සම්බන්ධයෙන් මෙකී ප්‍රජාව අතිශයින් වැදගත් වේ. උරුම භූමියක් තුළ මෙකී ප්‍රජාවගේ හැසිරීම මගින් පූජනීය උරුම භූමියක අනන්‍යතාව මතු කර පෙන්වනු ලැබේ. එය ආගමික නොවන ප්‍රජාවට වුව ස්ථානීය හැඟීම් දැනවීමට ප්‍රබල ආධාරකයක් ද වේ.

ආගමික උරුමස්ථානයන්හි ස්ථානීය ඇල්ම (Place attachment) සහ අනන්‍යතාව වැදගත් වේ. ස්ථානීය ඇල්ම දේශීය ආගමික වන්දනාකරුවන්ට සංවේදී බන්ධනයකි. එය ස්ථානීය සංස්කෘතික අර්ථයට සමීපව උත්පාදනය වන්නකි. පුද්ගල සහ සාමූහික හැසිරීම කෙරෙහි එය බලපානු ලැබේ. මේ තුළින් නිර්මාණය වන පසුබිම ස්ථානීය ආරක්ෂාව, යහපැවැත්ම තහවුරු කිරීමට උපකාරී වේ. එසේ ම ස්ථාන අර්ථකථනයට ගැඹුරු අරුතක් සාධනය කෙරේ. මේ තුළින් ඒක පුද්ගල මෙන් ම සාමූහිකත්වය පිළිබඳ අරුතක් ජනිත කරයි.

## 4. සිද්ධස්ථාන වන්දනාව

චෛතිය වන්දනාව තුළ පොදු ජන ආගමික චින්තනයේ ස්වරූපය කියාපාන විශේෂ අංග රාශියක් ගැබ්ව පවතී. '*ධාතුසු ඨිතාසු බුද්ධා ඨිතාව හොන්ති*' (සම්මෝහ විනෝදනී පිට 431). 'ධාතූන්ගේ පිහිටීම බුදුන්ගේ පැවැත්ම හා සමාන ය' යන සංකල්පය අනුව ශාරීරික ධාතු නිදන් කොට තැනූ දාගැබ් වන්දනාව වැදගත් සේ සලකන ලද නිසා බෞද්ධ වන්දනාවන්හි චෛතිය වන්දනාවට ලැබුණේ ප්‍රමුඛ ස්ථානයකි. බුදුන් වහන්සේ යැ යි සලකා චෛත්‍ය වන්දනයත්, උන්වහන්සේගේ පාරිභෝගික චෛත්‍යය ලෙස බෝධි වන්දනයත්, බුදුන් උදෙසා තනන ලද ප්‍රතිමා හා චෛත්‍ය වන්දනයත් බෞද්ධ වන්දනා වස්තු අතරට එක් වී ඒ වටා ගෙතුණු සම්ප්‍රදායක් සහ ආචාර පද්ධති ආගමික චින්තනයේ විශේෂ ලක්ෂණ ලෙස දැක්විය හැකි ය. පූජා විධීන් අතර පොදු ජනයා බහුල වශයෙන් තෝරාගෙන ඇත්තේ ආමිස පූජාවන් ය. මල් පහන්, ආහාරපාන, සුවඳ දුම් ආදිය යොදා චෛත්‍ය වන්දනය කිරීම ආමිස පූජාවේ ලක්ෂණයක්ව පැවතීමත් මේ අනුව පෙනේ.

බුදුන්ගේ ලංකාගමනේ දී සමාධි සුවයෙන් වැඩ සිට පිවිතුරු බවට පත් කළ තැන් සොළොසක් විය. ගමන් පහසුව නොමැති පැරණි යුගවල මෙම සොළොස්මස්ථාන කරා ගොස් වන්දනාමාන කිරීම එතරම් පහසු නොවූවද එම පූජනීය ස්ථාන ගැන

පොදු ජනයා දැක්වූයේ අසීමිත ශ්‍රද්ධාවකි. මෙම සිද්ධස්ථාන මතකයේ රඳවා ගනිමින් ඒ ගැන කියැවෙන ගාථාවේ අනුපිළිවෙළට විහාර බිත්තිවල හෝ පුස්කොළ ධර්ම ග්‍රන්ථවල ආවරණ ලෑල්ලේ ඇතුල් පැත්තේ චිත්‍රවත් කර මතකයේ රඳවා ගැනීමත් දැකගත හැකි ය. බුදු දහම වූ කලී මෝක්ෂය සාක්ෂාත් කිරීම සම්බන්ධ ඉගැන්වීමෙන්ද, එයට අනුකූල ප්‍රතිපත්ති හා පුද පූජා චර්යා රටාවකින්ද යුක්ත ආගමකි. මෙහි එන පුද පූජා සියල්ල ගොනු වී ඇත්තේ බුදුන්ගේ ත්‍රිවිධ චෛත්‍ය වටාය. ශාරීරික, පාරිභෝගික, උද්දේසික වශයෙන් චෛත්‍ය තුනක් අට්ඨකථාවන්හි විස්තර වේ. ජීවමාන බුදුන්ට කෙරෙන පුද පූජා සහ වන්දනාමාන මෙකී ත්‍රිවිධ චෛත්‍යයන්ට සිදු කිරීමෙන් ප්‍රතිපත්ති මාර්ගයේ අංගයක් සපුරා ගත හැකි බව ඉගැන්වේ. මේ ත්‍රිවිධ චෛත්‍ය සංකල්පය ලංකාවේ ප්‍රජාව අතර ජනප්‍රිය සංකල්පයක්ව තිබේ.

බ්‍රිතාන්‍ය ආධිපත්‍ය නිසා ඇති වූ සාමය සහ දියුණුව හේතුකොටගෙන සිංහල බෞද්ධයා වර්තමාන කාලයෙහි ඔවුන්ගේ පැරණි ස්තූපයන් ප්‍රකෘතිමත් කිරීමටත්, අලුත් ස්තූපයන් බැඳවීමටත් සැලකිල්ලක් දක්වයි. කෙසේ වුවද මෑතකාලීන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පරණවිතානගේ (1947) අදහස අනුව ශතවර්ෂ සතකට වඩා වැඩි කාලයක් පැවති අතපසු වීමට වඩා අධික වූ හානිකර ප්‍රතිඵල මෙම ප්‍රතිසංස්කරණයන් නිසා සිදුවී ඇති බවයි. අනුරාධපුර සහ අනෙකුත් ස්ථානවල පිහිටි පැරණි ස්තූපයන් ප්‍රතිසංස්කරණය කොට ඇත්තේ ඒවායේ ආදි ස්වරූපයන් වෙනස් කරමින් බැවින් අලංකාර කලා කෘති විනාශ වී තිබේ. මේ හේතුව නිසා දැන් අපට අයත්ව තිබෙන්නේ සුදු හුණු ගෑ ගල් ගොඩවල් පමණකි. පැරණි ස්තූපයන්හි විශේෂ ලක්ෂණයන් වූ ප්‍රමාණානුකූලතා කිසිවක් නොදක්නා ලැබේ. ඒවා ප්‍රජා සංවේදීතාවක් ජනනය කරයි (Mazumdar 2009). මෙම ස්ථාන කිසියම් කණ්ඩායමකගේ අතීතය, සම්ප්‍රදාය පිළිබඳ සබඳතාවක් නිර්මාණය කරන අතර, ස්ථානීය අනන්‍යතාවේ අඛණ්ඩතාව සහ වර්ධනය පිළිබඳ අදහසක්ද ජනනය කරවයි.

පූජනීය ස්ථාන දේශීය ප්‍රජාවට වැදගත් වන්නේ තත් ස්ථානාශ්‍රිතව සිදුවන ආගමික ක්‍රියාකාරකම් හේතුවෙනි. පූජනීය ස්ථානයක් ආශ්‍රිතව බැතිමතුන්ගේ අන්තර් ක්‍රියාව වැදගත් අත්දැකීමක් වන්නේ එය කෙනෙකුගේ ආගමික විශ්වාසය මෙන් ම ප්‍රජාව සමග මෙන් ම ස්ථානය සමග සංවේදී බන්ධනයක් ඇති කිරීමට සමත් වන බැවිනි. තත් ස්ථානයන්හි ප්‍රජා හැසිරීම ආධ්‍යාත්මික මෙන් ම සංවේදී වන බැවින් ඒක

පුද්ගලිකව මෙන් ම සාමූහිකව තත් ස්ථානය කෙරෙහි බැඳීමක් ජනිත කරයි (Mazumdar 1993). ස්ථානීය ඇල්ම සංකල්පය ශ්‍රී ලංකාවේ කෙතරම් සමීප දෙයක්ද යන්න ස්ථාන කරා නොගොස් කවර ස්ථානයක දී වුව සිදුකරන වන්දනාමානවල දී සොළොස්මස්ථාන වන්දනා කිරීම මගින් පෙනේ. ප්‍රජා මනස තුළ නිරන්තරයෙන් පූජනීය ස්ථාන පිළිබඳ ගෞරවයක් පවතී. මේ තුළ චෛතිය වන්දනාවට ප්‍රමුඛත්වයක් හිමි වේ. බුදුන් ලංකාගමනයේ දී සමාධි සුවයෙන් වැඩ සිටි, පිවිතුරු බවට පත්කළ තැන් සොළොසක ඉදි වූ චෛත්‍ය අනෙකුත් සිද්ධස්ථාන අතර මුල් තැන්හිලා සැලකීම ගිහි පැවිදි සැමදෙනාගේ ම ආකල්පය විය.

අනුරාධපුර වන්දනාවේ යන පිරිස් සිරිත් පරිදි සන්සුන්ව සිල් සමාදන් වී බෞද්ධ වත් පිළිවෙත් රකිමින් අටමස්ථාන වන්දනාවේ යෙදීම සිරිතකි. රටේ විවිධ පළාත්වලින් පැමිණෙන වන්දනාකරුවන්ගේ එකම අරමුණ වන්නේ වන්දනා කිරීම ය. යටත් විජිත යුගයේ පවා සක්‍රීයව ක්‍රියාත්මක වූ බව අනුරාධපුර මෙම හැසිරීම වූ බව 1903 ජුනි මස 09 වන පොසොන් පොහෝදිනය පිළිබඳව සටහනක් උපුටා දක්වන අභයසුන්දරගේ (1994) පහත සඳහනින් පැහැදිලි වේ.

> ‘1903 ජුනි මස 09 වන දිනට පොසොන් පුර පසළොස්වක් පොහෝ දින යෙදී තිබුණේය. සිරිත් පරිදි බෞද්ධයෝ අනුරාධපුර වන්දනාවට එක් රැස් වූහ. ලක්දිව බුදු සසුන පිහිටුවා අවුරුදු දෙදහස් දෙසිය එකොළසක් පිරුණේය. විසි දහසකට නොඅඩු පිරිසක් අනුරාධපුරයට වන්දනාවේ පැමිණ සිටියහ. සිරිත් පරිදි මොවුහු ශාන්ත දාන්තව සිල් සමාදන් වී බෞද්ධ වත් පිළිවෙත් රකිමින් අටමස්ථාන වන්දනාවේ යෙදෙමින් පසුවූහ. උඩරට පළාත්වලින් මෙන්ම පහතරට පළාත්වලින්ද පැමිණි වන්දනාකාරයෝ ඒ අතර වූහ. මොවුන්ගේ එකම අරමුණ, වූයේ වන්දනා කිරීමය. එයින් බැහැර කිසිම අරමුණක් ඔවුන් අතර නොවීය. අරුණෝදයේ පටන් ආරම්භ වූ බෞද්ධ චාරිත්‍ර පවත්වමින් ඔවුහූ එකම බොදු පිරිසක් සේ පසුවූහ (අභයසුන්දර 1994: 121).

## 5. අවිච්ඡින්නතාව/අඛණ්ඩතාව

ප්‍රජා සහ සම්බන්ධතාව සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් ස්ථානයක අවිච්ඡින්නතාව ප්‍රකට කරන ලක්ෂණයකි. ශ්‍රී ලාංකේය ආගමික උරුම සන්දර්භය තුළ

අවිච්ඡින්නතාව ඉතා වැදගත් වේ. මේ තුළ පරිණාමයද වැදගත් වේ. නිදසුනක් ලෙස, බෞද්ධ ආරාමය / පන්සල ගත් විට ඒ තුළ භික්ෂුව විවිධ උපයෝගීතා සහිත ආගමික සංකේත සහ ප්‍රජා සබඳතාව එහි ගාමක බලවේග වේ. මෙම සංඝටක අතර පවත්නා සබඳතාව අන්‍යෝන්‍ය, අවියෝජනීය මෙන් ම අන්තර් පරාධීන වේ. පෞරාණික ආරාම තුළ මෙන් ම, නූතන පන්සල් තුළ ද උක්ත සංඝටක ත්‍රිත්වයේ සබඳතාව ආරක්ෂා වී පවතී. එය අවිච්ඡින්න සම්ප්‍රදායකට කදිම නිදසුනකි. මෙකී ස්පර්ශනීය සාධකයන්හි සුසංගත සබඳතාවේ ප්‍රතිඵලයක් ලෙස ධර්මයේ පැවැත්ම තහවුරු වේ. ජීවමාන ආගමික උරුමස්ථානයන්හි ජීවමානබව සහ අඛණ්ඩතාවයේ බලවේගයන් අප විසින් තේරුම්ගත යුතු වේ (රූප සටහන 1). වෙනස්වීම, විතැන් වීම, පරිණාමය වීම වැනි ලක්ෂණද මෙකී සම්ප්‍රදායේම අවියෝජනීය අංගයන් ය. ශ්‍රී මහා බෝධිය, ස්තූප (ථූපාරාමය, රුවන්වැලි සෑය, අභයගිරිය, ජේතවනය) දළදා මාළිගාව වැනි ආගමික උරුමස්ථාන පිළිබඳව සලකා බැලීමේදී ඒවා වර්තමානය දක්වා පැමිණීමේ රහස මෙම අවිච්ඡින්නතාව හිමි කරගත් සම්ප්‍රදායයි. ඒවා කාලීන උපයෝගීතාවයන්ට අදාළ වීමද අඛණ්ඩතා පැවැත්ම තහවුරු කිරීමට හේතු වේ.

අවච්ඡින්තාව උදෙසා උරුමයට අනුබද්ධ සමාජය විසින් දෙනු ලබන නැතහොත් ආරෝපණය කරනු ලබන ඇගයීම් තීරණාත්මකය. උරුම සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා මෙන් ම සංරක්ෂණ ක්‍රියාවලිය තුළින්ද අවිච්ඡින්නතාව උදෙසා බලපෑම් සිදු වේ.

බෞද්ධ සිද්ධස්ථාන කිසිවිටෙකත් මියගිය ස්ථාන සේ නොසලකන ලදි. යටත් විජිත පාලන සමය තුළ විද්‍යාත්මක රුචිකත්වයෙන් මෙහෙයවන ලද බ්‍රිතාන්‍ය විද්වතුන් අනුරාධපුර ස්මාරකය ආශ්‍රිතව පුරාවිද්‍යා ගවේෂණ, කැණීම් කටයුතු සිදුවන විට සිංහල බෞද්ධ ප්‍රජා ප්‍රති විරෝධය එල්ල වූයේ සිද්ධස්ථාන වලට අදාළව පර්යේෂණාත්මක ගවේෂණ සඳහා ඉඩදිය හැක්කේ බෞද්ධාගම මියගිය ආගමක් නම් පමණි යන අදහස මත පිහිටමිනි (හරිශ්චන්ද්‍ර 2001: 327). මින් පැහැදිලි වන්නේ මෙම අවිච්ඡින්තාව තුළ විද්‍යාත්මක ගවේෂණ, කැණීම්, පර්යේෂණ වැනි දෑ ප්‍රජාවෙන් ප්‍රතික්ෂේප වූ බවකි.


අනුරාධපුර වන්දනාවේ යාම, නොකඩවා පැවත ආ චිරාගත බෞද්ධ චාරිත්‍රයකි. බ්‍රිතාන්‍ය යුගය ඇරඹීමෙන් පසුවද මෙම බුදු සිරිත සිංහල බැතිමතුන් අතින් ගිලිහී නොගියේ ය. අනුරාධපුර වන ගහනයෙන් වැසී තිබුණත් අවුරුදු පතා වන්දනාවේ යාම සිරිත විය. වලිසිංහ හරිශ්චන්ද්‍රතුමාගේ වචනවලින් කිවහොත්

'...සිද්ධස්ථානයන්හී දේවල් දැකීම පිණිස ලක්දිව සෑම පළාත්වලින් සමූහයා අවුරුදු පතා අනුරාධපුරයට පැමිණෙයි.....'(අභයසුන්දර1994: 120). උක්ත සංස්කෘතික සන්ධාරයේ / අන්තර්ගතයේ උරුම ස්ථානයන්හි අනන්‍යතාව නිදසුනක් ලෙස උපුටා දක්වන උක්ත ගති ලක්ෂණත්‍රයෙන් සමන්විත වූ බැවින් සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා සියලු පාර්ශ්වයන්ගේ නොමද සහායක් ලැබිණ.

අනුරාධපුර ස්තූප සංරක්ෂණ / ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් සැලකීමේ දී සංස්කෘතික සන්ධාරයේ (Cultural content) පැවැත්ම විවිධ ස්වරූපයන් නිරූපණය කරයි. ඓතිහාසිකව රුවන්වැලි සෑය "මහා ථූපය" ලෙස ජන මනසේ සුවිශේෂත්වයක් සටහන් කර තිබුණි. එය ආගමික මෙන් ම ජාතික සංකේතයක් බවට පත්ව තිබුණි. ඒ නිසාම ඓතිහාසිකව ස්ථානය ආශ්‍රිතව විවිධ ආගමික ක්‍රියාකාරකම් සඳහා ප්‍රජා සහසම්බන්ධතාව අඛණ්ඩව / අවිච්ඡින්නව ක්‍රියාත්මක විය. ඒ නිසාම යටත් විජිත අවධියේ සිට එය ප්‍රතිසංස්කරණය උදෙසා දේශීය ප්‍රජාව තුළ ප්‍රමුඛතාවක් විය. සංස්කෘතික සන්ධාරය උපරිම ලෙස පවත්නා විට පූර්ණ ප්‍රතිසංස්කරණයක් කරා ගමන් කිරීම නොවැළැක්විය හැක්කකි. හේතුව එහි අරමුණ, අනන්‍යතාව පූර්ණ ලෙස ප්‍රතිස්ථාපනය කිරීම වන බැවිනි. අතිශයින් ම පූජනීය සංකේතයක් වන ස්තූප අඛණ්ඩව ප්‍රතිසංස්කරණය / නවීකරණය සාම්ප්‍රදායිකව සිදුවුවත්, යටත්විජිත පාලන සමය තුළ අකර්මණ්‍ය විය. එහෙත් ඒවා සම්බන්ධ අගයන් කිසිදා ජන මනසින් වියැකී නොගියේ ය.

එම ප්‍රමුඛතාව නිහඬ ප්‍රජා මූල ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයන් ප්‍රතිසංස්කරණ සමාගම් (Restoration societies) හරහා සිදු විය. රුවන්වැලි සෑ චෛත්‍ය වර්ධන සමිතිය පිළිසකර කටයුතු 1873 ආරම්භ වී 1940 ජනවාරි 25 දින කොත් පැළඳවීමේ උත්සවයෙන් අවසන්වන ප්‍රතිසංස්කරණ කටයුත්ත සැබැවින්ම කියාපාන්නේ උක්ත සංස්කෘතික සන්ධාරයේ ප්‍රබලත්වය තුළින් ජනිත කළ අනන්‍යතාව ප්‍රජා මූල සංරක්ෂණ ක්‍රියාදාමයන් හරහා සාර්ථක වීමය. මෙය ජාතික, ආගමික, සංස්කෘතික මෙන් ම ඓතිහාසික සිද්ධියක් ලෙස අභයසුන්දර (1994: 259) හඳුන්වා දෙන අතර මෙම සිද්ධිය සම්බන්ධයෙන් 1939 සැප්තැම්බර් 01 දින සිංහල බෞද්ධයා පුවත්පතට කතු වැකියක් සපයන හේමපාල මුනිදාස මෙසේ පවසයි.

‘දුටුගැමුණු වැනි මහා ප්‍රතාපවත් යෝධ වීර්ය ඇති නරවරයෙකු විසිනුදු නිම කිරීමෙහිලා අපොහොසත් වූ, නටඹුන් වූ කල මහා පරාක්‍රමබාහු,විජයබාහු ආදී මහ බලැති නරේශ්වරයන්ගේ පරිශ්‍රමයෙන් පමණක්ම ප්‍රතිසංස්කරණයට පත් වූ, මේ මහා සෑ වහන්සේ අත්‍යන්තයෙන්ම නෂ්ටප්‍රායව පවතිද් දී ආගන්තුක එම හිමය කරා ආගමනය කළ දුගී මගී සඟ නමක් මෙබඳු අධිෂ්ඨානයක් ඇතිකර ගැනීමත්, උන්වහන්සේගේ පියවර ඔස්සේ ගිය සෙසු සැදැහැවතුන් සමූහයක් එම අධිෂ්ඨානය මුදුන්පත් කරලීමත් වූ කලී පෞද්ගලික නොව ජාතික ජයග්‍රහණයකි.





රූප සටහන 2 - කාලත්‍රය තුළ ජීවමාන උරුමයේ පැවැත්මේ ගාමක බලවේග (රාජපක්ෂ 2017: 32).

නාරංවිට සුමනසාරාභිධානයෙන් පුරාවෘත්තගතව වෙසෙන මේ වීරයන් වහන්සේත්, උන්වහන්සේගේ අධිෂ්ඨානය පශ්චාත් කාලයේ ක්‍රියාවේ යෙදීමේ යෙදුණු බ්‍රහ්මචාරී වලිසිංහ හරිශ්චන්ද්‍ර, හේනේගම සිටුගේ අප්පුහාමි, ඇවරිවත්තේ රන්සිරිතෙල් පෙරේරා අප්පුහාමි ආදී එම පින්වතුන් අනුව යමින් මේ මහා සෑ වහන්සේ අද පවත්නා විජයස්ථානයට ළඟා කළ පින්වතුන්, ඒ සැමට කේන්ද්‍ර මණ්ඩලය වූ චෛත්‍ය වර්ධන සමාගමත් වර්තමානයේ වෙසෙන සිංහලයින්ගේ

මෙන් ම අනාගතයේ විශාල වන අනන්ත සිංහලයන්ගේ ද අතුල්‍ය කෘතඥතාවයට පාත්‍ර වණු ඒකාන්ත ය.” (අභයසුන්දර 1994:259)

1870 ලීෂිං විනිශ්චයකාරතුමා විසින් තබන ලද සටහනකින් පැහැදිලි වන්නේ අනුරාධපුරය කෙතරම් කැලෑවෙන් වැසී තිබුණත්, ජනගහනයෙන් අඩු වී තිබුණත් වන්දනාකරුවන්ගේ ගමන් බිමන් අවිච්ඡින්නව පැවැති බවකි (අභයසුන්දර 1994: 120).




1940 ජනවාරි 23 රුවන්වැලි සෑ කොත් පැළඳවීමේ උත්සවයට සහභාගී වූ ජන සන්නිපාතය ලක්ෂ පහ ඉක්මවා සිටි බවත් ඔවුන්ගේ සාධුකාර මධ්‍යයේ සර් ඩී. බී. ජයතිලක ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා විසින් කොත පැළඳ වූ බවත් සඳහන් වේ (අභයසුන්දර 1994: 259). මේ හරහා ප්‍රජා සහසම්බන්ධතාව ස්තූපයේ ආගමික උපයෝගීතාව සහ එහි අවිච්ඡින්නතාව තවදුරටත් තහවුරු විය. ප්‍රජාව මේ ජයග්‍රාහී අවස්ථාව සලකනු ලැබුවේ අනුරාධපුර ශුද්ධ නගරය ආරක්ෂා කිරීම සඳහා ගෙන ගිය ව්‍යාපාරයේ සන්ධිස්ථානයක් ලෙස මෙන් ම අතීත ශ්‍රී විභූතිය පිළිබඳව කිසියම් සදාදරණීය හැඟීම් මාත්‍රයක් පළ කළ අවස්ථාවක් ලෙස ය. මින් ප්‍රකාශ කරන කරුණක් නම් ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ උරුමය ස්ථිතික සංකල්පයක් නොව ගතික සංකල්පයක් බවයි. ඒ පරිණාමය තුළ වර්තමානයට අදාළ වීමද වැදගත් වේ. මෙහිදී සංරක්ෂණ වෘත්තිකයෙකු අතින් සිදුවිය යුත්තේ ප්‍රජා අවශ්‍යතා සහ අපේක්ෂාවන්ට පරිවර්තනය කිරීමකි. ඒ අනුව සංරක්ෂණය ප්‍රජා අවශ්‍යතා


ආමන්ත්‍රණය කරන යානයක් වන අතර ඒ හරහා උරුමයේ අවිච්ඡින්න ගතිකත්වය තහවුරු කළ හැකි වේ.

සංස්කෘතික සන්ධාරය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ස්තූපයේ ප්‍රතිසංස්කරණයේ සාර්ථකත්වය ක්ෂේත්‍රයේ හැසිරීම නිරීක්ෂණය කරන කවර මධ්‍යස්ථ නිරීක්ෂකයෙකුට වුව පැහැදිලි වේ. සතියේ, සති අන්ත සහ විශේෂ පෝය දිනවල මෙන් ම වසර පුරාම ක්ෂේත්‍රය ජීවමාන, පූජනීය ස්ථානයක් ලෙස සක්‍රීයව පවතී. සුවිශේෂ ජාතික, ආගමික ක්‍රියාකාරකම් රැසක් (ජය පිරිත්, පිච්ච මල් පූජා, සීල ව්‍යාපාර) ලක්ෂ සංඛ්‍යාත ප්‍රජා සහ සම්බන්ධතාවෙන් සිදු වේ. දෙස් විදෙස් සාමාජිකයින් 100% කගේ වන්දනයට සහ නැරඹීමට ලක්වන ස්ථානයක් බවටද පත්වී ඇත.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 80 සහ 90 දශකවල මිරිසවැටි ප්‍රතිසංස්කරණය සංස්කෘතික සන්ධාරය (උපයෝගීතාව, ප්‍රජා සහ සම්බන්ධතාව සහ අවිච්ඡින්නතාව) පිළිබඳ ඇගයීමකින් අනතුරුව සිදු කරන ලද ප්‍රතිසංස්කරණයකි. එවකට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවංක විශ්වාසය වූයේ ප්‍රතිසංස්කරණය තුළින් ආගමික ප්‍රජා අවශ්‍යතා තෘප්තිමත් කිරීමය (Wijesuriya 1993: 42). මෙහ දී දේශීය ආගමික ප්‍රජාව පිළිබඳව වෘත්තිකයින් සංවේදී වී ඇති අතර සංරක්ෂණ විද්‍යාත්මක සහ තාක්ෂණික ක්‍රමවේදයන්හි අරමුණ ද ප්‍රජා අවශ්‍යතාව ආමන්ත්‍රණය කිරීම ය. ඒ තුළින් අනුරාධපුර අටමස්ථාන උරුම සංකල්පය තුළ අවිච්ඡින්න ගතිකත්වය ආරක්ෂා වී ඇති බවත්, ස්මාරකය සමග ප්‍රජා සහ සම්බන්ධතාව සහ ආගමික ක්‍රියාකාරකම් නිරීක්ෂණ ඔස්සේ පර්යේෂකයාට තහවුරු කරගත හැකි විය. අනුරාධපුරයට පැමිණෙන විදේශීය, දේශීය සංචාරකයින්ගේ නැරඹීමට ලක්වන සංස්කෘතික අගයෙන් උසස් ජීවමාන ක්ෂේත්‍රයකි. දේශීය බැතිමතුන්ගේ අටමස්ථාන සංකල්පය තුළ තවමත් ජීවමාන සක්‍රීය ආගමික ක්ෂේත්‍රයක් ශ්‍රී ලාංකේය උරුම සන්දර්භය තුළ සංස්කෘතිය සහ ස්මාරක සංරක්ෂණය පිළිබඳ සංකථනයේ සුවිශේෂ සන්ධිස්ථානයක් මෙම ස්මාරක සංරක්ෂණය තුළින් ප්‍රකට වේ.

උක්ත රුවන්වැලි සෑ ප්‍රතිසංස්කරණය සහ මිරිසවැටි ප්‍රතිසංස්කරණ සාර්ථක සංරක්ෂණ ප්‍රවණතා දෙකකි. රුවන්වැලි සෑය තුළින් ප්‍රජා අවශ්‍යතාවන් ප්‍රජාව විසින්ම සමූහ සංගතව මුදුන් පමුණුවා ගැනීමත්, මිරිසවැටිය ප්‍රතිසංස්කරණය

තුළින් සංරක්ෂණ වෘත්තිකයින් රාජ්‍ය යාන්ත්‍රණය හරහා ප්‍රතිපාදන ආයෝජනයෙන් ඉටු කිරීමට ගත් ප්‍රයත්නයත් පිළිබිඹු වේ.




රූප සටහන 3- එද මෙදා තුර අනුරාධපුර ස්තූප සංරක්ෂණයේ දිශානතිය (රාජපක්ෂ 2017:21).


ජේතවනය සහ අභයගිරිය ස්තූප සංරක්ෂණ 90 දශකයේ සිට ආරම්භ වන්නේ උරුමය ගෝලීයකරණය වූ පසුබිමකය. එමෙන් ම උරුම සංරක්ෂණය සහ කළමනාකරණය දේශීය සහ ජාත්‍යන්තර මට්ටමින් ආයතනගත වූ, වෘත්තීමය කාර්යයක් ලෙස නිර්වචනය වූ පසුබිමක ය. 1980 ජනවාරි මස 01 වන දින ජේතවනාරාම පුදබිමේ ස්තූපය අභියස යුනෙස්කෝ ශ්‍රී ලංකා සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය නිල වශයෙන් උත්සවාකාරයෙන් ආරම්භ වීමේ අවස්ථාව සංකේතවත් කරනු ලබන්නේ උරුමය සංරක්ෂණය පිළිබඳ ජගත් යාන්ත්‍රණය ශ්‍රී ලංකාවේ ජීවමාන ස්මාරක වන ස්තූප සංරක්ෂණය කිරීම උදෙසා ආරෝපණය කිරීමකි. මෙම ජාත්‍යන්තර සංරක්ෂණ ප්‍රවේශයට අවතීර්ණ වීම කාලීනව සිදුවන්නේ ඊට පෙර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ ප්‍රජා මූල ස්තූප සංරක්ෂණ රැසක අත්දැකීම් මත

ය. මෙම සුවිශේෂ ප්‍රවේශය එතෙක් ශ්‍රී ලාංකිකයින් උරුම සංරක්ෂණ ක්ෂේත්‍රයට ආවේණික නොවූ "සංස්කෘතික ත්‍රිකෝණ","මධ්‍යම සංස්කෘතික අරමුදල" සංකල්පමය සහ නෛතික ආයතනික ප්‍රවේශයක් තුළ සිදුවීමද සුවිශේෂය. මීට පෙර සංරක්ෂණයන්හි දී මුහුණදුන් ප්‍රජා ගැටලු, නෛතික ගැටලු, ආයතනික ගැටලු, සංකල්පමය ගැටලු හා මූල්‍යමය ගැටලු මෙන් ම වෘත්තීමය ගැටලු රැසක් එකවර නව යාන්ත්‍රණයක් තුළ දැවැන්ත ආකාරයෙන් ආමන්ත්‍රණය වීමක් මේ හරහා සිදු විය.

ජේතවන ස්තූප සංරක්ෂණය සඳහා අනුගත ප්‍රවේශය ද්‍රව්‍යමූල, ද්විතීයික ඇගයීම් පාදක, වෘත්තීමය ආධිපත්‍ය සහිත ප්‍රවේශයක් වීම තුළ අප මීට පෙර සඳහන් කරන ලද සංස්කෘතික සන්ධාරය පිළිබඳ අවතක්සේරුවක් සිදුවූයේ කෙසේද? යන්න විමසා බැලිය යුතු වේ.

දශක තුනකට අධික කාල පරාසයක් තුළ නිමා වූ මෙම ස්තූප සංරක්ෂණ තුළ Laurajane Smith (2012) සඳහන් කරන අධිපත්‍යවාදී උරුම සංකථනයේ (Authorized Heritage Discourse) ලක්ෂණ රැසක් පිළිබිඹුවන බව පර්යේෂකයාගේ අදහසයි. එනම් සෞන්දර්යාත්මක, ද්‍රව්‍යාත්මක ස්ථාන / ක්ෂේත්‍ර සංරක්ෂණය සඳහා තෝරාගැනීම, වෘත්තීමය ආධිපත්‍ය සමස්ත සංරක්ෂණ ක්‍රියාදාමය පුරාම ක්‍රියාත්මක වීම, විශ්වීය උරුම අගයන් සහ සංරක්ෂණ මූලධර්ම මත හා අන්තර්ජාතික ප්‍රඥප්ති මත පදනම් වීම, උරුමයේ ද්‍රව්‍යමූල පදනම මත පිහිටා කටයුතු කිරීම, උරුමය සමග සක්‍රීයව බද්ධ වීමකට වඩා අක්‍රීයව සම්බන්ධ වීමට ඇරයුම් කරන දුරස් පසුබිමක් තුළ උරුමය ඉදිරිපත් කිරීම සහ නරඹන්නන්, සංචාරකයින් අරමුණු කර සරල අර්ථකථනයක් කරා ගමන් කිරීම, විද්වතුන්, උරුම ක්ෂේත්‍රය සහ නරඹන්නන් අතර උපරි අධෝ සබඳතාවන් ස්ථාපිත කිරීම හඳුනාගත හැකි ය.

උක්ත ප්‍රවේශයන්හි ප්‍රතිඵලයක් ලෙස සංස්කෘතික සන්ධාරයට (උපයෝගීතාව, ප්‍රජා සහසම්බන්ධතාව හා අවිච්ඡින්නතාව) යම් ආකාරයකට අහිතකර ලෙස බලපා ඇති බව ක්ෂේත්‍ර නිරීක්ෂණයෙන් මෙන් ම පාර්ශ්වකරුවන් සමග සිදුකළ සම්මුඛ සාකච්ඡා මෙන් ම ප්‍රශ්නාවලි ගවේෂණයෙන් ද පැහැදිලි වේ.




රූප සටහන 4 - ජීවමාන උරුමය හා ප්‍රජා සබඳතාවය (රාජපක්ෂ 2017:375).

නූතන වටහා ගැනීමට අනුව උරුමය යනු දෙයක් (thing), ක්ෂේත්‍රයක් (site), ගොඩනැගිල්ලක් හෝ ද්‍රව්‍යාත්මක භාණ්ඩයක් පමණක් නොවේ. ඒවා ඒ ආශ්‍රිතව සිදුවන ගතික ක්‍රියාදාමය අර්ථකථනයෙහිලා සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරයි. Smith (2006) යෝජනා කරන්නේ උරුම ක්ෂේත්‍රය පවා ක්ෂේත්‍රය තුළ සිදුවන අතීතය අනුස්මරණය කරන වර්තමාන ක්‍රියාදාමයට පහසුකම් සපයන ආධාරකයක් බවයි. මෙම අදහසට සමීප නිර්වචනයක් සපයන හාවි (Harvey 2001) ද ප්‍රකාශ කරන්නේ උරුමය මානව ක්‍රියාදාමයන්ට සහ ආයතනයන්ට සම්බන්ධ ක්‍රියාවක් බවත්, ඒ හරහා සමාජ සංස්කෘතික අනන්‍යතාවක් ස්ථාපිත කිරීමක් සිදු වන බවත් ය. උරුමය කාලය තුළ ස්ථිතික හෝ අක්‍රීය වූ දෙයක්ද නොවේ. එය ගතික ක්‍රියාවලියක් වීම තුළ ස්ථාපිත අගයන් සහ අර්ථයන් අඛණ්ඩව නිර්මාණය වීමක්ද සිදු වේ.

උරුම සංරක්ෂණය හරහා අනන්‍යතා සංරක්ෂණයක් සහ ඒ තුළින් උරුම ස්ථානය සාමාජීය, සංස්කෘතික ස්ථානයක් බවට පත් කිරීම වැදගත් ය. උරුමය භෞතික නියෝජනයක් සහ අස්පර්ශනීය සංකේතාත්මක ක්‍රියාකාරකම් හරහා සිදුවන නියෝජනයක් ද වේ. එහෙයින් උරුම සංරක්ෂණයක් හරහා වියුක්ත අනන්‍යතාවක් ප්‍රතිනිර්මාණය නොවිය යුතුය. ඒ තුළ ස්ථානීය අගයක් තිබිය යුතු ය. එය කිසියම් පුද්ගලයෙකුට, ප්‍රජා කණ්ඩායමකට, ජාතියකට ස්ථානගත කිරීමට පහසුවන අයුරින් සිදුවීම වැදගත් ය.

## 6. අන්තර් ක්‍රියාව

ක්ෂේත්‍රයක් තුළ සිදුවන්නා වූ අන්තර් ක්‍රියාව තුළින් ලබන අත්දැකීම හරහා ප්‍රජාවන් අතර බන්ධනයක් ජනිත කරවයි. මතකයන් බෙදා හදා ගැනීම, සංස්කෘතිය බෙදා හදා ගැනීම, අනන්‍යතා බෙදා හදා ගැනීම ආදිය ඊට අයත් අංශ කිහිපයකි. මෙබඳු ප්‍රාථමික ප්‍රජා අගයන් ද්විතීයික කිරීම උරුමයේ අවිච්ඡින්නතාව පිළිබඳ ගැටලු මතු කරයි. අනුරාධපුර, ජේතවන සහ අභයගිරි ස්තූප සංරක්ෂණ තුළින් පසක් වී ඇති යථාර්ථය නම් "ජීවමාන ආගමික උරුම සංකේතයන් සංරක්ෂණයේ දී ජාත්‍යන්තරව ස්ථාපිත සංරක්ෂණ මූලධර්ම සහ මෙහෙයුම් නිර්ණායකයන්ට වඩා දේශීය සංස්කෘතික ප්‍රජා අගයන් වැදගත් වන බවයි". එනම්, සංස්කෘතික සන්ධාරය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සංස්කෘතික සන්ධාරයම සැලකිල්ලට ගත යුතුය යන්න ය.

උරුමය හුදෙක් පුරාවිද්‍යාත්මක හෝ ඓතිහාසික ලේඛනවලට සීමා කළ නොහැකි ය. එය යමෙකුගේ උරුමයකි. එය ද්‍රව්‍යමය වුවත් ප්‍රජා අනන්‍යතාවට සහ අයිතියකට සම්බන්ධ වේ. උරුමය වෙනුවෙන් කථා කිරීමේ අයිතිය කා සතු විය යුතුද? එය ප්‍රජාව විය යුතුද? විද්වතුන් / විශේෂඥයන් විය යුතුද?. අතීත උරුම අර්ථකථනය රටින් රටට වෙනස් වන අතර ඒ තුළ ප්‍රජා අර්ථකථනය ඉතා ප්‍රබල වේ. හේතුව උරුමයේ අවිච්ඡින්නතාවට එය ප්‍රබල ගාමක බලවේගයක් වන බැවිනි. ඒ නිසාම ප්‍රජාව සිය අයිතිය ලෙස සලකන සංස්කෘතික අර්ථයන්ට ගරු කිරීම වැදගත් වෘත්තීමය ආචාර ධර්මයකි. නිදසුනක් ලෙස ගෝත්‍රික ඇබොරිජින් ප්‍රජාව සිය ගුහා චිත්‍ර නැවත නැවත ප්‍රතිචිත්‍රණය කිරීම (repaint) සිය අයිතියක් ලෙස සලකයි. මෙය නූතන සංරක්ෂණ විද්‍යාත්මක දෘෂ්ටියෙන් ගැටලු සහගත විය හැකි ය. එයට හේතුව විවිධ ප්‍රජාවන් තම අතීතය උරුමයන් සමග පවත්වන සබඳතාවේ වෙනසයි. ඒ තුළ ඒකීය බවක් නැති අතර පවත්නේ විවිධත්වයකි. මේ හේතුවෙන් සංරක්ෂණය උදෙසා විශ්වීය මූලධර්ම අනුගත කිරීම සැබැවින් ගැටලු සහගත විය යුතුම ය. එහෙයින් ප්‍රජා මූල, අගයන් පාදක සංරක්ෂණය එහි ගතිකත්වයට මෙන් ම අවිච්ඡින්නතාවට බලපාන අතර තිරසාර භාවයටද හේතු වේ.

සංරක්ෂණ විෂය අතිශයින් විවාදාපන්න මාතෘකාවකි. කවර සංරක්ෂණ ක්‍රමවේදයන් නිවැරදිද යන්න ගැටලු සහගතය. මෙහි දී කිසියම් ආකාරයක තුලනයක් අවශ්‍ය

වේ. එනම් විද්‍යාත්මක ගුණයත්, සංරක්‍ෂණයේ සංස්කෘතික සන්දර්භය සහ පරමාර්ථයන් අතර සංහිඳියාවත් ය.

සංරක්‍ෂණයේ සාමාජීය කාර්යභාරයක් ද පවතී. එනම්, අතීත උරුමයන් වර්තමාන සමාජයට ඇති අදාළත්වයයි. එහෙයින් ජීවමාන උරුම ක්ෂේත්‍රවල සංරක්‍ෂණ ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේ දී  සංස්කෘතික සන්ධාරයට ප්‍රමුඛත්වයක් දීම වැදගත් වන අතර තථ්‍යතාව, අද්විතීය විශ්වීය අගය, ආර්ථික අගය වැනි ද්විතීයික ඇගයීම් ද්විතීයික විය යුතු ය. ඒවා උරුමයේ ද්වීතියික ප්‍රජාවක් විසින් ආරෝපිත ගුණයන් වන බැවිනි. ද්විතීයික ඇගයීම්වලට ප්‍රමුඛත්වය දී ප්‍රාථමික ඇගයීම් අවතක්සේරු කොට සංරක්ෂණය කිරීම දේශීය වශයෙන් අර්බුද නිර්මාණය වීමට හේතු වේ.

## 7. කර්තෘත්වය සුරැකීම

දකුණු ආසියාතික බොහෝ රටවල උරුම සංරක්‍ෂණය පිළිබඳ මූලධර්ම සහ ප්‍රතිපත්ති සම්පාදනය වීමේ දී බටහිර යුරෝපීය සුසමාදර්ශය (paradigm) ප්‍රබල ලෙස බලපා ඇත. යටත්විජිත රාජ්‍ය ලෙස පවත්නා සමයේ සහ ඉන් අනතුරුව දෙවන ලෝක යුද්ධයෙන් පසුව උරුමය පිළිබඳ සංකල්පය ගෝලීයකරණය වීමේ ප්‍රතිඵලයක් ලෙස සම්පාදනය වන අන්තර්ජාතික ප්‍රඥප්ති හරහා මේ තත්ත්වය තවදුරටත් තීව්‍ර වන්නට විය. සෙසු දකුණු ආසියාතික රටවල් මෙන් ම ශ්‍රී ලංකාවේ පැරණි ස්මාරක සංරක්‍ෂණය පිළිබඳ ස්ථාවර නියෝග සම්පාදනයේ දී ඉන්දියාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පවතින සමයේ ජෝන් මාෂල් (John Marshall) විසින් 1922 වසරේ දී සම්පාදිත සංරක්‍ෂණ අත්පොත (Conservation manual), එක්සත් රාජධානියේ 1980 වසරේ දී ටී. ඒ. බෙයිලි (T. A. Bailey) විසින් තම රට සඳහා සම්පාදිත ලේඛනය, එසේ ම රෝමයේ ස්මාරක ප්‍රතිසංස්කරණ වාර්තා යන මේවායේ ආභාසය ලැබී ඇත( Silva 1979).

ඓතිහාසික ගොඩනැගිලි සංරක්‍ෂකයින් අතර ඒවා ආරක්‍ෂා කරගැනීම පිළිබඳ වඩාත්ම යෝග්‍ය ප්‍රවේශය පිළිබඳ වාද විවාද අඛණ්ඩව සිදුවෙමින් පවතී. දාර්ශනිකව එක් පිරිසක් ඓතිහාසික ව්‍යුහයන් ඒවායේ මුල් ස්වරූපයට හැකිතාක් සමීප වන ලෙස නඩත්තු කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන අතර, සෙසු කණ්ඩායම පෙන්වා දෙන්නේ එම ව්‍යුහයන් සමකාලීන භාවිතාවන් සඳහා අනුගත

කරගැනීම වඩා සුදුසු බවයි. පවත්නා ආකාරයෙන් ආරක්ෂා කිරීම (preservation), එසේ ම ප්‍රතිසංස්කරණය (restoration) එනම් ව්‍යුහය මුල් තත්වයට ආපසු හැරවීම අපේක්ෂා කරන අතර, ප්‍රතිනිර්මාණය (reconstruction) යන්නෙන් පැරණි සැලැස්මට අනුව නව ව්‍යුහයක් ඉදි කිරීම අදහස් කෙරේ. ඓතිහාසික ගොඩනැගිලි නූතන භාවිතාවන්ට ගැළපෙන ලෙස සකස් කිරීම අනුවර්තනය කිරීම (adaptation) නමින් හැඳින් වේ. ඓතිහාසික ස්මාරක සහ ගොඩනැගිලිවල කර්තෘත්වය සහ ඒකාබද්ධතාව සම්බන්ධයෙන් උක්ත තාක්‍ෂණික සංරක්‍ෂණ මැදිහත්වීම්වල ආකල්පය විවිධ වේ. ආරක්‍ෂා කිරීම (preservation) සහ ප්‍රතිසංස්කරණය (restoration) ක්ෂේත්‍රයක තථ්‍යතා පවත්වා ගැනීම සම්බන්ධයෙන් තීරණාත්මක වන අතර ප්‍රතිනිර්මාණය (reconstruction) තුළින් ඒකාබද්ධතාව (integrity) පවත්වා ගැනීමට දායක වේ. ක්ෂේත්‍රයේ තථ්‍යතාව අවශ්‍යතාවන් සහ ඒකාබද්ධතාවේ අවශ්‍යතාවන් ඉටු කිරීමට යාමේ දී නිරන්තර අර්බුදයක් ජනිත වේ.

ජගත් උරුම අරමුණු ඉලක්කගත කරනු ලබන්නේ අවම මැදිහත්මක් සහිත ආරක්‍ෂා කිරීමේ (preservation) අන්තය වන අතර, වැනිසියේ ප්‍රඥප්තිය (Vanice charter), වියානා සම්මුතිය (Vienna memorandum) මෙන් ම යුනෙස්කෝව සහ එහි උපදේශක සභාවන්ද අවධාරණය කරනු ලබන්නේ ආරක්‍ෂා කිරීම, සංරක්‍ෂණය සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලීන්ය (ICOMOS 1964). එහෙත් ප්‍රායෝගිකව යුනෙස්කෝව ප්‍රතිනිර්මාණයන්ට සහ අනුවර්තනීය සංරක්ෂණමය මැදිහත්වීමට අවකාශය ලබා දී ඇත.

මෙහෙයුම් නිර්ණායකවල (Operational guidelines) සඳහන් වන්නේ පුරාවිද්‍යාත්මක ශේෂ හෝ ඓතිහාසික ගොඩනැගිලි ප්‍රතිනිර්මාණය කළ හැක්කේ සුවිශේෂ අවස්ථාවන්හි පමණක් බවයි. තව ද, එය සිදුකළ හැක්කේ පරිපූර්ණ සවිස්තරාත්මක වාර්තාකරණය පදනම් කොට මිස උපකල්පන මත නොවේ. ජනාවාස වූ ක්ෂේත්‍රවල ගතිකත්වය, නඩත්තු කිරීම උදෙසා අනුවර්තන ක්‍රියාවලියද දිරිගන්වනු ලැබේ. ඒ අනුව තථ්‍යතාව සහ ඒකාබද්ධතා සංකල්පයන්ගේ භාවිතාව රඳා පවතින්නේ ක්ෂේත්‍රයේ ස්වභාවය මත ය.


ක්ෂේත්‍රයක සංස්කෘතික අර්ථය ප්‍රතිජනනය කිරීම සංරක්‍ෂණමය මැදිහත්වීමක දී වඩා වැදගත් වන්නේ එම ක්ෂේත්‍ර පූජනීය ජීවමාන ආගමික ක්ෂේත්‍රයන් වූ විටය. එම සංස්කෘතික අර්ථය ප්‍රතිනිර්මාණය කිරීමේ දී අවම ද්‍රව්‍යමය මැදිහත්වීමකින්

යුරෝපීය තථ්‍යතා සංකල්පය මත එය සිදු කිරීම අභියෝගාත්මක ය. එහි දී මැදිහත්වීම් ලෙස පූර්ණ ප්‍රතිසංස්කරණයක් හෝ ප්‍රතිනිර්මාණයන් වැදගත් විය හැකි ය. එමෙන් ම නව ද්‍රව්‍ය හඳුන්වාදීම, හැඩය, ක්‍රියාව ආදී සංස්කෘතික අර්ථයට බලපාන තීරණාත්මක සාධක කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

අධ්‍යයනය සඳහා තෝරාගෙන ඇති ක්ෂේත්‍ර ද්වයෙහි කර්තෘත්වය ආරක්ෂා කිරීම පිළිබඳව වෙනස් වූ ගැටලු මතු කර ඇත. ක්ෂේත්‍ර දෙකම ජගත් උරුම භූමි වුවත් දෙකෙහිම ජගත් උරුම ප්‍රඥප්තියේ සඳහන් කර්තෘත්වය (authenticity) සහ ඒකාබද්ධතාව (integrity) පිළිබඳ සංකල්ප ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයන් සම්බන්ධයෙන් අභියෝගාත්මක අරමුණු බව පැහැදිලි ය.

## 8. ද්‍රව්‍ය මූල සංරක්ෂණ ප්‍රවේශය සහ අභියෝග

උරුමස්ථාන සංරක්ෂණයේ දී අනුගමනය කෙරෙන ද්‍රව්‍ය පදනමීය ප්‍රවේශය 'අධිපත්‍යවාදී උරුම සංකථනය' ලෙස ද හඳුන්වනු (Smith 2006) ලබන අතර එහිදී ද්‍රව්‍ය ආරක්ෂා කිරීම අරමුණු කෙරේ. එය 19 වන සියවසේ යුරෝපයේ කේම්බ්‍රිජ්




රූප සටහන 5 - ද්‍රව්‍යමූල සංරක්ෂණ ප්‍රවේශය (රාජපක්ෂ 2017:376).

කැම්ඩන් (Cambridge Camden) සංගමය මෙන් ම ජෝන් රස්කින්, විලියම් මොරිස් වැන්නන්ගේ පුරෝගාමීත්වයෙන් ජනිත වන සංරක්ෂණ ව්‍යාපාරය තුළින් 20 වන සියවසේ තුන්වන කාර්තුවේ වැනිස් ප්‍රඥප්තිය (Venice Charter) සහ ලෝක උරුම ප්‍රඥප්තිය හරහා ජාත්‍යන්තරකරණයට ලක් විය. උක්ත ජාත්‍යන්තර ප්‍රඥප්ති ද්වය තුළ මෙම ද්‍රව්‍යාත්මක ප්‍රවේශය මැනවින් ප්‍රකට වේ.ද්‍රව්‍ය මූල ප්‍රවේශය ඓතිහාසිකව විශේෂඥ මූලික ප්‍රවේශයක් වන අතර එහිදී අනුබද්ධ ප්‍රජාව යම් ප්‍රමාණයකට නොසලකා හැරේ. උරුමයේ අගය ද්‍රව්‍ය මූලිකව පුරාවිද්‍යාත්මක, ඓතිහාසික සහ සෞන්දර්යාත්මක දෘෂ්ටිකෝණයන්ගෙන් සලකා බැලේ (රූප සටහන 5). එහිදී නූතන විද්‍යාත්මක සංරක්ෂණ මූලධර්ම සහ භාවිතාවන් තුළින් උරුමයේ ආරක්ෂාව පමණක් සංරක්ෂණ වෘත්තිකයින්ගේ අපේක්ෂාව වේ. උරුමයේ භෞතික ව්‍යූහය ආරක්ෂා කිරීම උදෙසා අවම මැදිහත්ම අපේක්ෂා කරන අතර, ද්‍රව්‍යාත්මක ව්‍යූහය නවීකරණය කළ නොහැකි සම්පතක් (Non-renewable resource) ලෙස සැලකේ. සංරක්ෂණයේ මූලික අරමුණක් වන්නේ අතීත උරුමයට වර්තමාන ප්‍රජාවගෙන් එල්ලවන අහිතකර බලපෑම් වලින් බේරාගනිමින් අනාගතය වෙත බාරදීමේ අපේක්ෂාවයි .

මේ හරහා වර්තමාන ප්‍රජාව සහ ආගමික ස්මාරක අතර සබඳතාව වියුක්ත කිරීමක් සිදුවීම නොවැළැක්විය හැකි ය. මෙම ප්‍රවේශය කාරණා කීපයක් මත විවේචනයට ලක් වේ. එනම්,


- සංරක්ෂණ ක්‍රියාවලිය සහ එහි ප්‍රතිඵල සංරක්ෂණ වෘත්තිකයින් මත පමණක් තීරණය වීම
- ප්‍රජා සහයෝගය මත නොව රාජ්‍ය ආධාර මත රඳා පැවතීම
- සංරක්ෂණ ක්‍රියාවලිය හෝ එහි අවසන් ඵලය ක්ෂේත්‍රයට සම්බන්ධ දේශීය ආගමික ප්‍රජාව විසින් වැළඳ නොගැනීම
- කළමනාකරණ යාන්ත්‍රණය මෙන් ම නඩත්තුව තිරසාර නොවීම
- අවසන් ප්‍රතිඵලය ලෙස උරුමය සහ ප්‍රජාව අතර සබඳතාව දුරස් වීම මත දිගුකාලීනව ක්ෂේත්‍රයේ පැවැත්මට අභියෝග එල්ල වීම

ශ්‍රී ලංකාවේ අනුරාධපුර ලෝක උරුම නගරය තුළ පසුගිය දශක තුන තුළ සංරක්ෂණය කරන ලද දැවැන්ත ආරාම සංකීර්ණ දෙකක් වන ජේතවන සහ


අභයගිරි විහාර සංකීර්ණයන්හි ස්තූප සංරක්ෂණයන් උක්ත අවදානම් සහගත තත්ත්වයනිට මුහුණ දී ඇති බව කිව හැකි ය.

## 9. අගය මූලික ප්‍රවේශය

අගය මූලික ප්‍රවේශයේ මූලික අරමුණ වන්නේ උරුමයන් හා සම්බන්ධ විවිධ පාර්ශ්ව/ කණ්ඩායම් නියෝජනය කරනු ලබන සමාජයේ ඇගයීම් ( Values ) පිළිබඳ සංවේදීව කටයුතු කිරීම ය. පසුගිය දශක කීපය තුළ වර්ධනය වූ පශ්චාද් සන්තතික පුරාවිද්‍යාව සහ පශ්චාද් නූතනවාදී සංකල්ප ඔස්සේ පුරාවස්තු අර්ථකථනයේ දී සහ සංරක්ෂණයේ දී ඇගයීම් දෘෂ්ටිකෝණයන්ගේ වැදගත්කම හොඩර් (Hoder 1991), වැනි විද්වතුන් අවධාරණය කර ඇති අතර මෙම ප්‍රවේශය වර්තමානයේ වඩාත්ම වැදගත්ප්‍රවේශයක් ලෙස උරුම සංරක්ෂණයේ දී සැලකේ. මේ සම්බන්ධයෙන් මෑත කාලයේ දී ජගත් වෘත්තිකයින්ගේ අවධානය 1999 ඕස්ට්‍රේලියානු අයිකොමොස් බරා ප්‍රඥප්තිය (Burra Charter 1999) තුළින් මෙන් ම ගෙටී සංරක්ෂණ ආයතනයේ සහ ඉක්රෝම් (ICCROM) වැනි අන්තර්ජාතික උරුම සංරක්ෂණ ආයතනයන්ගේ ව්‍යාපෘති තුළින් ද ක්‍රියාවට නැගීමට ප්‍රයත්න දරා ඇත. ඇගයීම් පාදක ප්‍රවේශ සන්දර්භය තුළ උරුමය හා සම්බන්ධ පාර්ශ්ව කණ්ඩායම් මෙන් ම ප්‍රජාව සහ ඔවුන්ගේ ඇගයීම් සංරක්ෂණයේ දී මුඛ්‍ය කොට සැලකේ (රූප සටහන 6). ද්‍රව්‍ය මූල ප්‍රවේශයේ දී මෙන් නොව මෙහිදී ප්‍රජාව සහ පාර්ශ්ව කණ්ඩායම් උරුමය මත ආරෝපණය කරන නිර්වචන සහ ඇගයුම් වැදගත් වන අතර එය සමාජ ක්‍රියාවලියක්ද වේ . ඒ නිසාම උරුමය ආරක්ෂා කිරීම යනු අවම මැදිහත්වීමක් තුළින් සිදු කෙරෙන හුදු භෞතික සංරක්ෂණයක් පමණක්ම අදහස් නොවන අතර උරුමයේ පාර්ශ්ව කණ්ඩායම් ඒ මත ආරෝපිත ඇගයුම් ආරක්ෂා කිරීම සිදුවිය යුතු වේ. මේ හරහා සංරක්ෂණ ක්‍රියාවලිය තුළින් සියලු පාර්ශ්ව හා බද්ධ වෙමින් විවිධ ඇගයීම් තුලනය කරමින් මතුවිය හැකි විසටනාත්මක තත්ත්වයන් අවම කරගැනීමට කටයුතු කෙරේ. පාර්ශ්ව කණ්ඩායම්වල මැදිහත්වීම විවිධ ප්‍රවේශ එනම් උපදේශාත්මකව සක්‍රීය සහභාගීත්වය විධිමත් නෛතික රාමුවක් හරහා සිදුවිය හැකි ය.




රූප සටහන 6 - අගයමූල සංරක්ෂණ ප්‍රවේශය(රාජපක්ෂ 2017:378).




රූප සටහන 7 - ජීවමාන උරුම සංරක්ෂණ ප්‍රවේශය (රාජපක්ෂ 2017:379).

අගය මූල ප්‍රවේශයන්ගෙන් උරුම සංරක්ෂණ ශික්ෂණය සඳහා වූ වැදගත්ම දායකත්වය වන්නේ සංරක්ෂණ ක්‍රියාදාමය සඳහා ප්‍රජා මැදිහත්වීම, දිරිගැන්වීම සහ ප්‍රවර්ධනයයි. මෙකී ප්‍රවේශයන් සංරක්ෂණ වෘත්තිකයින් සතු අධිකාරීමය බලයක් නොවිය යුතු වුවත් ප්‍රායෝගික දුබලතාව නම් සංරක්ෂණ වෘත්තිකයින් සතුවන බලයයි. මෙහි දී නිරායාසයෙන්ම ඔවුන්ගේ බටහිර කේන්ද්‍රීය ද්‍රව්‍යාත්මක /

ස්පර්ශනීය උරුම සංරක්‍ෂණ ප්‍රවේශය ක්‍රියාත්මක වීම නොවැළැක්විය හැකි ය. සෙසු පාර්ශ්වකරුවන් විවිධාකාරයෙන් සංරක්‍ෂණ ක්‍රියාවලියට දායක වුවද සංරක්‍ෂණ ක්‍රියාවලිය ප්‍රායෝගිකව අධීක්‍ෂණය වන්නේ වෘත්තිකයින් හරහාය (Demas 2002). මේ අනුව සංරක්‍ෂණ වෘත්තිකයින්ද මේ ප්‍රවේශයේ දී ප්‍රායෝගිකව සක්‍රීය පාර්ශ්වකරුවන් පිරිසකි. අධිකාරී බලය ආයතනමය රාමුව හරහා කේන්ද්‍රගත වන්නේ ඔවුන් මත වන අතර සෙසු පාර්ශ්ව කණ්ඩායම් ඔවුන් හරහා තුලනය වීමක් සිදු වේ. ඒ අනුව මෙම ප්‍රවේශයේ ප්‍රායෝගික බව සැබැවින්ම ගැටලු සහගත ය (රූප සටහන 7).

ජීවමාන පූජනීය උරුම ස්ථානයක් ලෙස සංරක්ෂණ හෝ ප්‍රතිසංස්කරණ කිරීමේ දී සංරක්ෂණ වෘත්තිකයින්ගේ බටහිර සංකල්ප පදනමීය අගයන්ට වඩා දේශීය සංස්කෘතික අනන්‍යතාවයන් හා අගයන් වැදගත් වේ. දේශීය උරුමයේ ජීවමාන ආරෝපිත තත්ත්ව නියෝජනය කරන උරුමයේ භාරකරුවන්ගේ දැක්ම සහ අවශ්‍යතාවන් ද අගයන් සේ සලකා කටයුතු කිරීම ප්‍රායෝගික මෙන් ම උරුමයේ තිරසාර භාවයට ද තීරණාත්මක වේ. රුවන්වැලි සෑ ප්‍රතිසංස්කරණය ශ්‍රී ලංකා ඉතිහාසයෙහි ජගත් උරුම භූමියක් තුළ දේශීය උරුමයේ නෛසර්ගික ගති ලක්ෂණ වන පූජනීයත්වය, ජීවමාන බව, ආධ්‍යාත්මික ගුණය, අවිච්ඡින්නතාව, සංකේතාත්මක අගය වැනි ගති ලක්ෂණ සංරක්ෂණයට ගනු ලැබූ විශිෂ්ට ප්‍රයත්නයක් සේ සැලකිය හැකි ය. සංරක්ෂණයේ දී න්‍යෂ්ටික ප්‍රජා සම්බන්ධතාව, ප්‍රජා ඇල්ම වැනි සංකල්පවලට ගරු කරමින් සිදු වූ සංරක්ෂණක් නිසා උරුමය සහ වර්තමාන ප්‍රජාව අතර සබඳතාව දුරස් කිරීමට වඩා වර්ධනය කිරීමට හේතු වී ඇත. මෙය දේශීය උරුමයේ පුළුල් අරුත සඳහා කදිම පරමාදර්ශයකි.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය


අභයසුන්දර, පී. (1994), *බ්‍රහ්මචාරී වලිසිංහ හරිස්චන්ද්‍ර විමර්ශනය*, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ගොඩකුඹුර, සී. (1962), 1960-61 *මුදල් වර්ෂය සඳහා පුරාවිද්‍යා කොමසාරිස්ගේ පාලන වාර්තාව,* කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

පරණවිතාන, එස්. (1963), *ලංකාවේ ස්තූපය*, බොරලැස්ගමුවː විසිදුනු.

රාජපක්ෂ, ඒ. (2013), 'දළදා උරුමයː අනන්‍යතාව, අර්ථකථනය හා කළමනාකරණය',

ධීරානන්ද, එච්. (සංස්.) *සිරි දළදා හරසරණිය*, කොළඹː රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව. පි. 695-717.

රාජපක්ෂ, ඒ. එස්. ටී. (2016), 'උරුමය ගෝලීයකරණය වීම තුළ ශ්‍රී ලාංකේය පූජනීය උරුම ක්ෂේත්‍ර සංරක්ෂණයේ දිශානතිය සහ අර්බුදය', *සම්භාවනා,* පේරාදෙණි විශ්වවිද්‍යාලය, 9(2), පි. 15-39.

රාජපක්ෂ, ඒ. එස්. ටී. (2017), *ශ්‍රී ලංකාවේ සංස්කෘතික ත්‍රිකෝණයේ පිහිටි පූජනීය නගරයන්හි උරුම කළමනාකරණය සහ සංචාරක ව්‍යාපාරය ː අනුරාධපුරය සහ මහනුවර ලෝක උරුම ස්ථාන පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්,* දර්ශන විශාරද උපාධිය සඳහා ඉදිරිපත් කළ පර්යේෂණ නිබන්ධය, පේරාදෙණි විශ්වවිද්‍යාලය.

හරිශ්චන්ද්‍ර, ඩබ්ලිව්. (2001), *සිතියම් සහිත පුරාවිද්‍යාව*, බොරලැස්ගමුවː විසිදුනු.

*විසල් අනුරාධපුර සංවර්ධන යෝජනා ක්‍රමය* 1999.

*Antiquities Ordinance of 1940*, revised edition 1956 (Sri Lanka).

*Anuradhapura Preservation Board Act No. 32*, 1961.

*Anuradhapura Sacred Area Scheme 1984*, Colombo: Dept. of Town and Country Planning.

Bandaranayake, S. (1992) , *'International Recognition of the Problems of Conserving Cultural Monuments and Ancient City Centres'*, paper given at the Asian Regional Conference of the Commonwealth Association of Architects, Colombo.

Bianca, S. (2000), *Urban form in the Arab World: Past and Present.* Thames and Hudson.

Chidester, D., and Linenthal, E.T. (1995), *American Sacred Space***.** Bloomington: Indiana University Press.

Dearborn, L.M. and Stallmayer, J.C. (2010), *Inconvenient Heritage: Erasure and Global Tourism in Luang Prabang***.** Left coast Press.

Demas, M. (2002), Planning for Conservation and Management of Archaeological Sites in J M Teutonico and G. Palumbo, *Management Planning for Archaeological Sites*: An International Work- shop organised by the Getty Conservation Institute and Loyola Marymount University, May 2000, 27–54. Los Angeles: The Getty Conservation Institute.

Godakumbura, C. E., *'Administrative Reports of the Archaeological Department'*, 60/61 and 61/62 (Colombo).

Harvey, D.C. (2001), 'Heritage pasts and heritage presents: Temporality, meaning and the scope of heritage studies , *International Journal of Heritage Studies, 7(4), 319-338.*

Hodder, I. (1991), *Postprocessual Archaeology and the Current Debate*. In: R. Preucel, ed. Processual and Post- processual Archaeologies: Multiple Ways of Knowing the Past. Carbondale: Center for Archaeological Investigations,

ICOMOS (1964), *The Venice Charter: International Charter for the Conservation and Restoration of Monuments and Sites***.** Second International Congress of Architects and Technicians of Historic Monuments, Venice, Italy, 1964. Available at: www.icomos.org/venice_charter.html (accessed 8-5-2020).

ICOMOS (1987), *The Washington Charter: Charter for the Conservation of Historic Towns and Urban Areas,* Paris: ICOMOS.

ICOMOS (1994), *The Nara Document on Authenticity.* Available online at:www.international. Icomos.org/charters.htm.

ICOMOS (1979), *The Australia ICOMOS Charter for the Conservation of Places of Cultural Significance.*

ICOMOS (2001), *International Charters for Conservation and Restoration.* Paris: ICOMOS.

ICOMOS (2008), *The Quebec Declaration on the Preservation of the Spirit of Place,* Paris: ICOMOS.

Karistrom, A. 'Spiritual materiality: heritage preservation in a Buddhist world', *Journal of Social Archaeology*, 5 (3), 338-355.

Mazumdar, S. (1993), 'Sacred Space and Place attachment', *Journal of Environmental Psychology*, 13, 231-242.

Mazumdar, S., and Mazumdar, S. (2009), 'Religious place making and community building in diaspora', *Environment and Behaviour*, 41, 307-337.

McKercher, B. (1993), 'Some fundamental truths about tourism: Understanding tourism's social and environmental impacts', *Journal of Sustainable Tourism,* 1(1), 6–16.

McKercher, B., & du Cros, H. (2002), *Cultural tourism: The partnership between tourism and cultural heritage management.* Binghamton, NY: Haworth Press.

McKercher, B., Ho, P., & Du C, H. (2002), 'The relationship between tourism and cultural heritage'. In: Chon, K.et al. Wong (eds.). *Tourism in Asia: Development, marketing and sustainability.* pp. 386–394, Hong Kong: The Hong Kong Polytechnic University, SAR.

Paranavitana, S. (1947), *Protection of Ancient Monuments Other than those on Crown Land.* Ceylon Government Publication Bureau: Colombo.

Rajapakse, A. (2011), *'Evaluation of Heritage Planning Strategies of the World Heritage Site of Anuradhapura'*, in: Fist international conference of the International Association for Asian Heritage *(IAA)*, Colombo.

Silva, R. (1979), 'Conservation of ancient monuments under tropical conditions with special reference to Ceylon', *Ancient Ceylon, 3,* 297–314 (Colombo).

Silva, R. (1990), 'UNESCO-Sri Lanka project of the Cultural triangle', in: Wijesekera, N. (ed.) *History of the Department of Archaeology***,** 221–235.

Silva, R., and A.W.P. Guruge (1995), *The Safeguarding of the Cultural Triangle of Sri Lanka: Steady progress and future prospects.* Colombo: Central Cultural Fund.

Smith, L. (2006), *Uses of Heritage.* London: Routledge. NESCO 1972, Convention concerning the Protection of the World Cultural and Natural Heritage, Paris.

Wijesuriya, G. (1993), *Restoration of Buddhist Monuments in Sri Lanka: The Case for an Archaeological Heritage Management Strategy.* Colombo: ICOMOS, Sri Lanka.

Wijesuriya, G (2003), 'Conservation of Living Religious Heritage', Papers from the ICCROM 2003 *Forum on Living Religious Heritage: conserving the sacred,* Rome: ICCROM, pp. 31−43.

Wijesuriya, G (2005), 'Past is in the Present: Perspectives in caring for Budhist heritage'. In: Stovel, H., Stanley-Price N. and Killick, R. (ed.) *Conservation of living religious heritage. ICCROM Conservation Studies3 (ICCROM)*, Rome: 3143.

Wongsa, C.P. (2004), Heritage resource management in tourism. In: M. Bradford and E. Lee (eds.) *Tourism and cultural heritage in South East Asia.* Pp.41-53. Bankok: SEAMEO-SPAFA.